# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2011

# ඇගයීම් වාර්තාව

# 85 - ගෘහ ආර්ථික විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2011

## ඇගයීම් වාර්තාව

# 85 - ගෘහ ආර්ථික විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2011

## ඇගයීම් වාර්තාව

# 85 - ගෘහ ආර්ථික විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**ගෘහ ආර්ථික විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2011

## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, මෙම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

ගෘහ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2012 ඔක්තෝබර් 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර මයා<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර මිය<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය හා සංස්කරණය** | : | මනෝමි සෙනෙවිරත්න මිය<br>සහකාර විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | ඩබ්.ඩී.ආර්. ජයවර්ධන<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරිණී (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම |
| | | ආර්. මුණසිංහ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී (විශ්‍රාමික)<br>උසස් තාක්ෂණික ආයතනය<br>දෙහිවල. |
| | | සී. බෝගොඩ මිය<br>බප/කැල/විශාඛා බාලිකා විද්‍යාලය. |
| | | බී. පද්මිනි මංගලිකා මිය<br>බප/කැල/විශාඛා බාලිකා විද්‍යාලය. |
| | | එස්.අයි. තුරේෂා ඉස්මයිල්<br>බප/හො/අල්ගස්සාලි මධ්‍ය මහා විද්‍යාලය |
| **පරිගණක පිටපත සැකසුම** | : | එම්.ඩබ්. පියුමි මධුශානී මෙනවිය<br>දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යාතමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය 8

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 11

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 12
2.1.2 I ප්‍රශ්න පත්‍රය 12
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව 17
2.1.5 බහුවරණ ප්‍රශ්න සඳහා එක් එක් වරණයට ප්‍රතිචාර - ප්‍රතිශතයක් ලෙස 18
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ථ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 19

**2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 22**

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 22
2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන 23

## III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 37

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 38

## I කොටස

### 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

#### 1.1 විෂය අභිමතාර්ථ

★ ගෘහ කළමනාකරණයට අයත් විවිධ ක්ෂේත්‍රයන්ට අදාල ප්‍රායෝගික සහ ගැටලු විසඳීමේ ශිල්පීය ක්‍රම උපයෝගි කර ගැනීමේ හැකියාව මගින් සිසුන්ගේ ආත්ම විශ්වාසය හා ආත්මාභිමානය ගොඩනැගීම.

★ යහපත් පෝෂණමය පුරුදු ඇති කිරීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, වර්ධනය කිරීම තුළින් පෝෂණමය යහ පැවැත්ම පිළිබඳව වගකීම පිළිගැනීමට උනන්දු කරවීම.

★ ගෘහ ආර්ථික විද්‍යා විෂයය හා බැඳී විවිධ වෘත්තීමය අවස්ථා පිළිබඳ දැනුවත් බවක් ලබා දීම.

★ යහපත් ආකල්ප සහ සාරධර්ම වර්ධනය කිරීම මඟින් පුද්ගල සහ සමාජ සංවර්ධනය ඇති කිරීම.

ඉහත අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා සමාජ සබඳතා සමෝධානය කෙරෙන නිපුණතා පෙළක් වර්ධනය කර ගැනීමට සහාය වීම ගෘහ ආර්ථික විද්‍යා විෂයයෙන් අපේක්ෂා කෙරේ.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යාතමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 39588 | 979 | 40567 |
| දෙමළ | 8972 | 1328 | 10300 |
| ඉංග්‍රීසි | 0 | 39 | 39 |
| එකතුව | **48560** | **2346** | **50906** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 1366 | 2.81 | 12 | 0.51 | 1378 | 2.71 |
| B | 3129 | 6.44 | 47 | 2.00 | 3176 | 6.24 |
| C | 11894 | 24.29 | 368 | 15.69 | 12262 | 24.09 |
| S | 18646 | 38.40 | 1081 | 46.08 | 19727 | 38.75 |
| W | 13525 | 27.85 | 838 | 35.72 | 14363 | 28.21 |
| එකතුව | **48560** | **99.79** | **2346** | **100.00** | **50906** | **100.00** |

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 3774 | 179 | 4.74 | 268 | 7.10 | 985 | 26.10 | 1342 | 35.56 | 2774 | 73.50 | 1000 | 26.50 |
| 2. ගම්පහ | 4672 | 116 | 2.48 | 299 | 6.40 | 1113 | 23.82 | 1673 | 35.81 | 3201 | 68.51 | 1471 | 31.49 |
| 3. කළුතර | 2831 | 124 | 4.38 | 298 | 10.53 | 774 | 27.34 | 970 | 34.26 | 2166 | 76.51 | 665 | 23.49 |
| 4. මහනුවර | 3513 | 144 | 4.10 | 325 | 9.25 | 1007 | 28.66 | 1229 | 34.98 | 2705 | 77.00 | 808 | 23.00 |
| 5. මාතලේ | 1075 | 27 | 2.51 | 81 | 7.53 | 275 | 25.58 | 381 | 35.44 | 764 | 71.07 | 311 | 28.93 |
| 6. නුවරඑළිය | 1596 | 35 | 2.19 | 89 | 5.58 | 376 | 23.56 | 682 | 42.73 | 1182 | 74.06 | 414 | 25.94 |
| 7. ගාල්ල | 2995 | 102 | 3.41 | 216 | 7.21 | 803 | 26.81 | 1001 | 33.42 | 2122 | 70.85 | 873 | 29.15 |
| 8. මාතර | 1983 | 60 | 3.03 | 136 | 6.86 | 494 | 24.91 | 681 | 34.34 | 1371 | 69.14 | 612 | 30.86 |
| 9. හම්බන්තොට | 1287 | 79 | 6.14 | 135 | 10.49 | 376 | 29.22 | 417 | 32.40 | 1007 | 78.24 | 280 | 21.76 |
| 10. යාපනය | 1389 | 6 | 0.43 | 34 | 2.45 | 243 | 17.49 | 539 | 38.80 | 822 | 59.18 | 567 | 40.82 |
| 11. කිලිනොච්චි | 116 | 1 | 0.86 | 4 | 3.45 | 26 | 22.41 | 39 | 33.62 | 70 | 60.34 | 46 | 39.66 |
| 12. මන්නාරම | 174 | 7 | 4.02 | 11 | 6.32 | 57 | 32.76 | 66 | 37.93 | 141 | 81.03 | 33 | 18.97 |
| 13. වව්නියාව | 311 | 2 | 0.64 | 11 | 3.54 | 77 | 24.76 | 142 | 45.66 | 232 | 74.60 | 79 | 25.40 |
| 14. මුලතිව් | 66 | 1 | 1.52 | 0 | 0.00 | 10 | 15.15 | 24 | 36.36 | 35 | 53.03 | 31 | 46.97 |
| 15. මඩකලපුව | 713 | 7 | 0.98 | 21 | 2.95 | 149 | 20.90 | 286 | 40.11 | 463 | 64.94 | 250 | 35.06 |
| 16. අම්පාර | 885 | 6 | 0.68 | 31 | 3.50 | 182 | 20.56 | 369 | 41.69 | 588 | 66.44 | 297 | 33.56 |
| 17. ත්‍රිකුණාමලය | 459 | 4 | 0.87 | 16 | 3.49 | 100 | 21.79 | 188 | 40.96 | 308 | 67.10 | 151 | 32.90 |
| 18. කුරුණෑගල | 3667 | 160 | 4.36 | 356 | 9.71 | 1137 | 31.01 | 1311 | 35.75 | 2964 | 80.83 | 703 | 19.17 |
| 19. පුත්තලම | 1813 | 62 | 3.42 | 134 | 7.39 | 558 | 30.78 | 710 | 39.16 | 1464 | 80.75 | 349 | 19.25 |
| 20. අනුරාධපුරය | 1592 | 32 | 2.01 | 84 | 5.28 | 350 | 21.98 | 637 | 40.01 | 1103 | 69.28 | 489 | 30.72 |
| 21. පොළොන්නරුව | 652 | 8 | 1.23 | 21 | 3.22 | 109 | 16.72 | 286 | 43.87 | 424 | 65.03 | 228 | 34.97 |
| 22. බදුල්ල | 1923 | 78 | 4.06 | 144 | 7.49 | 508 | 26.42 | 706 | 36.71 | 1436 | 74.67 | 487 | 25.33 |
| 23. මොනරාගල | 940 | 4 | 0.43 | 21 | 2.23 | 176 | 18.72 | 341 | 36.28 | 542 | 57.66 | 398 | 42.34 |
| 24. රත්නපුරය | 2773 | 79 | 2.85 | 206 | 7.43 | 735 | 26.51 | 1050 | 37.87 | 2070 | 74.65 | 703 | 25.35 |
| 25. කෑගල්ල | 2116 | 30 | 1.42 | 143 | 6.76 | 522 | 24.67 | 840 | 39.70 | 1535 | 72.54 | 581 | 27.46 |
| **සමස්ත දිවයින** | **43315** | **1353** | **3.12** | **3084** | **7.12** | **11142** | **25.72** | **15910** | **36.73** | **31489** | **72.70** | **11826** | **27.30** |

වගුව 3

### 1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1308 | 95 | 7.26 | 86 | 6.57 | 301 | 23.01 | 453 | 34.63 | 935 | 71.48 | 373 | 28.52 |
| 2. හෝමාගම | 691 | 21 | 3.04 | 52 | 7.53 | 182 | 26.34 | 266 | 38.49 | 521 | 75.40 | 170 | 24.60 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 1062 | 48 | 4.52 | 92 | 8.66 | 317 | 29.85 | 378 | 35.59 | 835 | 78.63 | 227 | 21.37 |
| 4. පිළියන්දල | 713 | 15 | 2.10 | 38 | 5.33 | 185 | 25.95 | 245 | 34.36 | 483 | 67.74 | 230 | 32.26 |
| 5. ගම්පහ | 1071 | 26 | 2.43 | 78 | 7.28 | 273 | 25.49 | 394 | 36.79 | 771 | 71.99 | 300 | 28.01 |
| 6 මිනුවන්ගොඩ | 977 | 48 | 4.91 | 104 | 10.64 | 312 | 31.93 | 343 | 35.11 | 807 | 82.60 | 170 | 17.40 |
| 7. මීගමුව | 1406 | 17 | 1.21 | 57 | 4.05 | 267 | 18.99 | 505 | 35.92 | 846 | 60.17 | 560 | 39.83 |
| 8. කැලණිය | 1218 | 25 | 2.05 | 60 | 4.93 | 261 | 21.43 | 431 | 35.39 | 777 | 63.79 | 441 | 36.21 |
| 9. කළුතර | 1287 | 63 | 4.90 | 146 | 11.34 | 338 | 26.26 | 434 | 33.72 | 981 | 76.22 | 306 | 23.78 |
| 10. මතුගම | 672 | 28 | 4.17 | 68 | 10.12 | 217 | 32.29 | 227 | 33.78 | 540 | 80.36 | 132 | 19.64 |
| 11. හොරණ | 872 | 33 | 3.78 | 84 | 9.63 | 219 | 25.11 | 309 | 35.44 | 645 | 73.97 | 227 | 26.03 |
| 12. මහනුවර | 819 | 62 | 7.57 | 88 | 10.74 | 239 | 29.18 | 262 | 31.99 | 651 | 79.49 | 168 | 20.51 |
| 13. දෙනුවර | 449 | 10 | 2.23 | 47 | 10.47 | 120 | 26.73 | 152 | 33.85 | 329 | 73.27 | 120 | 26.73 |
| 14. ගම්පොල | 758 | 21 | 2.77 | 59 | 7.78 | 224 | 29.55 | 272 | 35.88 | 576 | 75.99 | 182 | 24.01 |
| 15. තෙල්දෙණිය | 385 | 8 | 2.08 | 31 | 8.05 | 84 | 21.82 | 144 | 37.40 | 267 | 69.35 | 118 | 30.65 |
| 16. වත්තේගම | 450 | 16 | 3.56 | 36 | 8.00 | 121 | 26.89 | 172 | 38.22 | 345 | 76.67 | 105 | 23.33 |
| 17. කටුගස්තොට | 652 | 27 | 4.14 | 64 | 9.82 | 219 | 33.59 | 227 | 34.82 | 537 | 82.36 | 115 | 17.64 |
| 18. මාතලේ | 567 | 15 | 2.65 | 43 | 7.58 | 149 | 26.28 | 195 | 34.39 | 402 | 70.90 | 165 | 29.10 |
| 19. ගලේවෙල | 318 | 11 | 3.46 | 30 | 9.43 | 84 | 26.42 | 123 | 38.68 | 248 | 77.99 | 70 | 22.01 |
| 20. නාඋල | 56 | 1 | 1.79 | 1 | 1.79 | 10 | 17.86 | 24 | 42.86 | 36 | 64.29 | 20 | 35.71 |
| 21. විල්ගමුව | 134 | 0 | 0.00 | 7 | 5.22 | 32 | 23.88 | 39 | 29.10 | 78 | 58.21 | 56 | 41.79 |
| 22. නුවරඑළිය | 437 | 7 | 1.60 | 21 | 4.81 | 101 | 23.11 | 193 | 44.16 | 322 | 73.68 | 115 | 26.32 |
| 23. කොත්මලේ | 151 | 3 | 1.99 | 15 | 9.93 | 30 | 19.87 | 72 | 47.68 | 120 | 79.47 | 31 | 20.53 |
| 24. හැටන් | 562 | 8 | 1.42 | 21 | 3.74 | 144 | 25.62 | 216 | 38.43 | 389 | 69.22 | 173 | 30.78 |
| 25. වලපනේ | 225 | 3 | 1.33 | 13 | 5.78 | 48 | 21.33 | 105 | 46.67 | 169 | 75.11 | 56 | 24.89 |
| 26. හඟුරන්කෙත | 221 | 14 | 6.33 | 19 | 8.60 | 53 | 23.98 | 96 | 43.44 | 182 | 82.35 | 39 | 17.65 |
| 27. ගාල්ල | 1274 | 49 | 3.85 | 95 | 7.46 | 354 | 27.79 | 413 | 32.42 | 911 | 71.51 | 363 | 28.49 |
| 28. ඇල්පිටිය | 676 | 26 | 3.85 | 53 | 7.84 | 175 | 25.89 | 240 | 35.50 | 494 | 73.08 | 182 | 26.92 |
| 29. අම්බලන්ගොඩ | 591 | 10 | 1.69 | 27 | 4.57 | 132 | 22.34 | 207 | 35.03 | 376 | 63.62 | 215 | 36.38 |
| 30. උඩුගම | 454 | 17 | 3.74 | 41 | 9.03 | 142 | 31.28 | 141 | 31.06 | 341 | 75.11 | 113 | 24.89 |
| 31. මාතර | 697 | 8 | 1.15 | 26 | 3.73 | 151 | 21.66 | 248 | 35.58 | 433 | 62.12 | 264 | 37.88 |
| 32. අකුරැස්ස | 426 | 10 | 2.35 | 47 | 11.03 | 120 | 28.17 | 148 | 34.74 | 325 | 76.29 | 101 | 23.71 |
| 33. මුලටියන-හක්මණ | 385 | 4 | 1.04 | 16 | 4.16 | 93 | 24.16 | 152 | 39.48 | 265 | 68.83 | 120 | 31.17 |
| 34. මොරවක-දෙනියාය | 475 | 38 | 8.00 | 47 | 9.89 | 130 | 27.37 | 133 | 28.00 | 348 | 73.26 | 127 | 26.74 |
| 35. තංගල්ල | 375 | 26 | 6.93 | 57 | 15.20 | 127 | 33.87 | 106 | 28.27 | 316 | 84.27 | 59 | 15.73 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 557 | 24 | 4.31 | 40 | 7.18 | 156 | 28.01 | 177 | 31.78 | 397 | 71.27 | 160 | 28.73 |
| 37. වලස්මුල්ල | 355 | 29 | 8.17 | 38 | 10.70 | 93 | 26.20 | 134 | 37.75 | 294 | 82.82 | 61 | 17.18 |
| 38. යාපනය | 449 | 4 | 0.89 | 12 | 2.67 | 84 | 18.71 | 164 | 36.53 | 264 | 58.80 | 185 | 41.20 |
| 39. දූපත | 131 | 0 | 0.00 | 2 | 1.53 | 17 | 12.98 | 43 | 32.82 | 62 | 47.33 | 69 | 52.67 |
| 40. තෙන්මාරච්චි | 164 | 1 | 0.61 | 7 | 4.27 | 33 | 20.12 | 66 | 40.24 | 107 | 65.24 | 57 | 34.76 |
| 41. වලිකාමන් | 459 | 0 | 0.00 | 9 | 1.96 | 87 | 18.95 | 197 | 42.92 | 293 | 63.83 | 166 | 36.17 |
| 42. වඩමරච්චි | 186 | 1 | 0.54 | 4 | 2.15 | 22 | 11.83 | 69 | 37.10 | 96 | 51.61 | 90 | 48.39 |
| 43. කිලිනොච්චි | 116 | 1 | 0.86 | 4 | 3.45 | 26 | 22.41 | 39 | 33.62 | 70 | 60.34 | 46 | 39.66 |
| 44. මන්නාරම | 173 | 7 | 4.05 | 11 | 6.36 | 57 | 32.95 | 65 | 37.57 | 140 | 80.92 | 33 | 19.08 |
| 45. මඩු | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 46. වව්නියාව | 275 | 2 | 0.73 | 11 | 4.00 | 68 | 24.73 | 128 | 46.55 | 209 | 76.00 | 66 | 24.00 |
| 47. වව්නියාව උතුර | 36 | 0 | 0.00 | 0 | 0.00 | 9 | 25.00 | 14 | 38.89 | 23 | 63.89 | 13 | 36.11 |
| 48. මුලතිව් | 60 | 1 | 1.67 | 0 | 0.00 | 10 | 16.67 | 21 | 35.00 | 32 | 53.33 | 28 | 46.67 |
| 49. තුනුක්කායි | 6 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 3 | 50.00 | 3 | 50.00 | 3 | 50.00 |
| 50. මඩකලපුව | 287 | 4 | 1.39 | 6 | 2.09 | 49 | 17.07 | 107 | 37.28 | 166 | 57.84 | 121 | 42.16 |
| 51. කල්කුඩා | 161 | 1 | 0.62 | 7 | 4.35 | 24 | 14.91 | 67 | 41.61 | 99 | 61.49 | 62 | 38.51 |
| 52. පදිරිප්පු | 201 | 1 | 0.50 | 7 | 3.48 | 51 | 25.37 | 80 | 39.80 | 139 | 69.15 | 62 | 30.85 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 64 | 1 | 1.56 | 1 | 1.56 | 25 | 39.06 | 32 | 50.00 | 59 | 92.19 | 5 | 7.81 |
| 54. අම්පාර | 407 | 4 | 0.98 | 19 | 4.67 | 90 | 22.11 | 184 | 45.21 | 297 | 72.97 | 110 | 27.03 |
| 55. කල්මුනේ | 79 | 1 | 1.27 | 4 | 5.06 | 15 | 18.99 | 37 | 46.84 | 57 | 72.15 | 22 | 27.85 |
| 56. සමන්තුරෙයි | 83 | 0 | 0.00 | 2 | 2.41 | 16 | 19.28 | 30 | 36.14 | 48 | 57.83 | 35 | 42.17 |
| 57. මහඔය | 126 | 1 | 0.79 | 3 | 2.38 | 32 | 25.40 | 46 | 36.51 | 82 | 65.08 | 44 | 34.92 |
| 58. දෙහිඅත්තකන්ඩිය | 132 | 0 | 0.00 | 2 | 1.52 | 22 | 16.67 | 36 | 27.27 | 60 | 45.45 | 72 | 54.55 |
| 59. අක්කරෙයිපත්තුව | 58 | 0 | 0.00 | 1 | 1.72 | 7 | 12.07 | 36 | 62.07 | 44 | 75.86 | 14 | 24.14 |
| 60. ත්‍රිකුණාමලය | 203 | 4 | 1.97 | 11 | 5.42 | 51 | 25.12 | 70 | 34.48 | 136 | 67.00 | 67 | 33.00 |
| 61. මුතූර් | 64 | 0 | 0.00 | 1 | 1.56 | 7 | 10.94 | 30 | 46.88 | 38 | 59.38 | 26 | 40.63 |
| 62. කන්තලේ | 36 | 0 | 0.00 | 0 | 0.00 | 6 | 16.67 | 13 | 36.11 | 19 | 52.78 | 17 | 47.22 |
| 63. කින්නියා | 156 | 0 | 0.00 | 4 | 2.56 | 36 | 23.08 | 75 | 48.08 | 115 | 73.72 | 41 | 26.28 |
| 64. කුරුණෑගල | 766 | 48 | 6.27 | 71 | 9.27 | 227 | 29.63 | 281 | 36.68 | 627 | 81.85 | 139 | 18.15 |
| 65. කුලියාපිටිය | 698 | 37 | 5.30 | 79 | 11.32 | 242 | 34.67 | 251 | 35.96 | 609 | 87.25 | 89 | 12.75 |
| 66. නිකවැරටිය | 542 | 11 | 2.03 | 51 | 9.41 | 173 | 31.92 | 188 | 34.69 | 423 | 78.04 | 119 | 21.96 |
| 67. මහව | 579 | 19 | 3.28 | 42 | 7.25 | 168 | 29.02 | 216 | 37.31 | 445 | 76.86 | 134 | 23.14 |
| 68. ගිරිඋල්ල | 585 | 27 | 4.62 | 59 | 10.09 | 176 | 30.09 | 208 | 35.56 | 470 | 80.34 | 115 | 19.66 |
| 69. ඉබ්බාගමුව | 497 | 18 | 3.62 | 54 | 10.87 | 151 | 30.38 | 167 | 33.60 | 390 | 78.47 | 107 | 21.53 |
| 70. පුත්තලම | 754 | 13 | 1.72 | 44 | 5.84 | 224 | 29.71 | 320 | 42.44 | 601 | 79.71 | 153 | 20.29 |
| 71. හලාවත | 1059 | 49 | 4.63 | 90 | 8.50 | 334 | 31.54 | 390 | 36.83 | 863 | 81.49 | 196 | 18.51 |
| 72. අනුරාධපුරය | 484 | 19 | 3.93 | 32 | 6.61 | 123 | 25.41 | 191 | 39.46 | 365 | 75.41 | 119 | 24.59 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 73. තඹුත්තේගම | 345 | 5 | 1.45 | 21 | 6.09 | 70 | 20.29 | 135 | 39.13 | 231 | 66.96 | 114 | 33.04 |
| 74. කැකිරාව | 383 | 7 | 1.83 | 23 | 6.01 | 81 | 21.15 | 140 | 36.55 | 251 | 65.54 | 132 | 34.46 |
| 75. ගලෙන්බිඳුනුවැව | 174 | 0 | 0.00 | 4 | 2.30 | 33 | 18.97 | 81 | 46.55 | 118 | 67.82 | 56 | 32.18 |
| 76. කැබිතිගොල්ලෑව | 206 | 1 | 0.49 | 4 | 1.94 | 43 | 20.87 | 90 | 43.69 | 138 | 66.99 | 68 | 33.01 |
| 77. පොළොන්නරුව | 160 | 1 | 0.63 | 6 | 3.75 | 31 | 19.38 | 74 | 46.25 | 112 | 70.00 | 48 | 30.00 |
| 78. හිඟුරක්ගොඩ | 279 | 7 | 2.51 | 13 | 4.66 | 50 | 17.92 | 125 | 44.80 | 195 | 69.89 | 84 | 30.11 |
| 79. දිඹුලාගල | 213 | 0 | 0.00 | 2 | 0.94 | 28 | 13.15 | 87 | 40.85 | 117 | 54.93 | 96 | 45.07 |
| 80. බදුල්ල | 699 | 31 | 4.43 | 52 | 7.44 | 193 | 27.61 | 247 | 35.34 | 523 | 74.82 | 176 | 25.18 |
| 81. බණ්ඩාරවෙල | 387 | 28 | 7.24 | 32 | 8.27 | 116 | 29.97 | 135 | 34.88 | 311 | 80.36 | 76 | 19.64 |
| 82. මහියංගනය | 205 | 2 | 0.98 | 13 | 6.34 | 54 | 26.34 | 85 | 41.46 | 154 | 75.12 | 51 | 24.88 |
| 83. වැලිමඩ | 495 | 16 | 3.23 | 39 | 7.88 | 118 | 23.84 | 183 | 36.97 | 356 | 71.92 | 139 | 28.08 |
| 84. පස්සර | 137 | 1 | 0.73 | 8 | 5.84 | 27 | 19.71 | 56 | 40.88 | 92 | 67.15 | 45 | 32.85 |
| 85. මොණරාගල | 265 | 0 | 0.00 | 5 | 1.89 | 47 | 17.74 | 90 | 33.96 | 142 | 53.58 | 123 | 46.42 |
| 86. වැල්ලවාය | 435 | 3 | 0.69 | 11 | 2.53 | 83 | 19.08 | 157 | 36.09 | 254 | 58.39 | 181 | 41.61 |
| 87. බිබිල | 240 | 1 | 0.42 | 5 | 2.08 | 46 | 19.17 | 94 | 39.17 | 146 | 60.83 | 94 | 39.17 |
| 88. රත්නපුර | 1182 | 32 | 2.71 | 82 | 6.94 | 311 | 26.31 | 465 | 39.34 | 890 | 75.30 | 292 | 24.70 |
| 89. බළන්ගොඩ | 434 | 18 | 4.15 | 51 | 11.75 | 117 | 26.96 | 147 | 33.87 | 333 | 76.73 | 101 | 23.27 |
| 90. නිවිතිගල | 565 | 10 | 1.77 | 40 | 7.08 | 157 | 27.79 | 217 | 38.41 | 424 | 75.04 | 141 | 24.96 |
| 91. ඇඹිලිපිටිය | 592 | 19 | 3.21 | 33 | 5.57 | 150 | 25.34 | 221 | 37.33 | 423 | 71.45 | 169 | 28.55 |
| 92. කෑගල්ල | 657 | 14 | 2.13 | 56 | 8.52 | 183 | 27.85 | 275 | 41.86 | 528 | 80.37 | 129 | 19.63 |
| 93. මාවනැල්ල | 601 | 8 | 1.33 | 46 | 7.65 | 140 | 23.29 | 228 | 37.94 | 422 | 70.22 | 179 | 29.78 |
| 94. දෙහිඕවිට | 858 | 8 | 0.93 | 41 | 4.78 | 199 | 23.19 | 337 | 39.28 | 585 | 68.18 | 273 | 31.82 |
| **සමස්ත දිවයින** | **43315** | **1353** | **3.12** | **3084** | **7.12** | **11142** | **25.72** | **15910** | **36.73** | **31489** | **72.70** | **11826** | **27.30** |

වගුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 3 | 0.01 | 50906 | 100.00 |
| 81 - 90 | 170 | 0.33 | 50903 | 99.99 |
| 71 - 80 | 1459 | 2.53 | 50736 | 99.67 |
| 61 - 70 | 4980 | 6.92 | 49447 | 97.13 |
| 51 - 60 | 12993 | 15.74 | 45926 | 90.22 |
| 41 - 50 | 24056 | 21.73 | 37913 | 74.48 |
| 31 - 40 | 37558 | 26.52 | 26850 | 52.74 |
| 21 - 30 | 46639 | 17.84 | 13348 | 26.22 |
| 11 - 20 | 50416 | 7.42 | 4267 | 8.38 |
| 01 - 10 | 50905 | 0.96 | 490 | 0.96 |
| 00 - 00 | 50906 | 0.00 | 1 | 0.00 |


වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. උදා : (31 - 40 පන්ති ප්‍රාන්තරය ගතහොත්)

මෙම විෂයය සඳහා 31 - 40 තෙක් ලකුණු ලබාගත් සංඛ්‍යාව 37558කි. එය ප්‍රතිශතයක් වශයෙන් 26.52% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 26850ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 52.74%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණය පරිදි දැක්විය හැක.

උදා:- මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 15වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 76%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 12වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 17%කි.

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, ඊට 100%ක්ම පිළිතුරු සපයා ඇත. 2 ප්‍රශ්නය තෝරාගත් පිරිස 26%ක් පමණ වේ.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින්, 76 - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 4%කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0 - 25% තෙක් ලකුණු 0 - 5 තෙක් ලබාගත් ප්‍රතිශතය ක් 29%කි.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් දක්වා ඇත.
උදා:- 1 ප්‍රශ්නයෙහි (ix) කොටසේ පහසුතාව 62%ක් වන අතර, (v) කොටසෙහි පහසුතාව 22% කි.

## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

කාලය පැය 01කි. මුළු ලකුණු 40කි.

- ⋆ මෙම ප්‍රශ්න පත්‍රය වරණ හතරක් සහිත බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තේරීම අපේක්ෂා කෙරේ.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

1. සංතෘප්ත මේද අම්ලයකි
   (1) ඔලෙයික් අම්ලය. (2) පාමිටික් අම්ලය. (3) ලිනොලෙයික් අම්ලය. (4) ලිනොලෙනික් අම්ලය.

2. තයිරොක්සින් හෝර්මෝනය නිපදවීම සඳහා අවශ්‍ය ඛනිජය වනුයේ
   (1) සින්ක් ය. (2) පොටෑසියම් ය. (3) අයඩින් ය. (4) පොස්පරස් ය.

3. නිරක්තියෙහි රෝග ලක්ෂණයකි
   (1) වමනය. (2) විඩාව. (3) සම රත් වීම. (4) උදරය විශාල වීම.

4. විටමින් C ලබා ගැනීම සඳහා වඩාත් සුදුසු ආහාර ප්‍රභව වනුයේ
   (1) පේර, ගොටුකොළ සහ නෙල්ලි ය. (2) වට්ටක්කා, අඹ සහ පැපොල් ය.
   (3) නාරං, කෙසෙල් සහ බෝංචි ය. (4) අන්නාසි, කරවිල සහ ගෝවා ය.

5. 'X' නමැති රාත්‍රී ආහාර වේලෙහි, ප්‍රධාන පෝෂක තුනට අමතරව කැල්සියම් හා විටමින් A ද බහුලව අඩංගුව තිබුණි. පහත දැක්වෙන ආහාර වේල් අතුරින් 'X' විය හැක්කේ කුමක් ද?
   (1) රතු කැකුළු බත්, කිරිගොස් මාළුව, ලීක්ස් තෙම්පරාදුව, මාළු ස්ටූ, පිපිඤ්ඤා සලාදය, අතුරුපසට ඉදුණු පේර
   (2) තම්බපු සහල් බත්, මස් කරිය, අල තෙම්පරාදුව, බටු මොජු, කතුරුමුරුංගා මැල්ලුම, අතුරුපසට කෙසෙල්
   (3) එළවළු බත්, අඹ චට්නි, සෝයා කරිය, අල බැදුම, කැක්කාරි සලාදය, අතුරුපසට ජෙලි
   (4) සම්බා බත්, පරිප්පු ව්‍යංජනය, හාල්මැස්සන් බැදුම, බෝංචි ව්‍යංජනය, කැරට් සම්බෝල, අතුරුපසට යෝගට්

6. ග්ලයිකොජන් බහුලව අඩංගු ආහාරයකි
   (1) මාළු. (2) මස්. (3) කරවල. (4) පීකුදු.

7. සහල්වල අඩංගු කාබොහයිඩ්‍රේටයකි
   (1) මෝල්ටෝස්. (2) පිෂ්ටය. (3) ලැක්ටෝස්. (4) පෙක්ටින්.

8. 'P' නමැති ආහාරයෙහි ප්‍රෝටීන් ප්‍රතිශතය අඩු වුව ද, එම ප්‍රෝටීනයේ ගුණාත්මක බව ඉතා ඉහළ ය. 'P' විය හැක්කේ
   (1) කිරි ය. (2) මස් ය. (3) සෝයා ය. (4) මුං ඇට ය.

9. පෝෂණය සම්බන්ධව සිසු කණ්ඩායමකගෙන් විමසූ විට ලැබුණු ප්‍රතිචාර කිහිපයක් පහත දැක්වේ.
   *A* - අස්ථි හා දත්වල වර්ධනයට කැල්සියම් අවශ්‍ය ය.
   *B* - සිරුරට ශක්තිය සැපයීම සඳහා යකඩ ක්‍රියා කරයි.
   *C* - විටමින් D මිනිස් සිරුර තුළ නිපදවා ගත හැකි ය.
   *D* - විදුරුමස්වල මනා පැවැත්ම සඳහා විටමින් K අවශ්‍ය වේ.
   මේවායින් නිවැරදි ප්‍රතිචාර දක්වනුයේ
   (1) *A* හා *D* වලිනි. (2) *B* හා *C* වලිනි. (3) *B* හා *D* වලිනි. (4) *A* හා *C* වලිනි.

10. සත්ත්වමය ආහාරවල අඩංගු වන ප්‍රෝටීන දෙකකි
    (1) කේසින් හා මයොසින්. (2) ලෙගියුමින් හා ඇල්බියුමින්.
    (3) මයොසින් හා ලෙගියුමින්. (4) කේසින් හා ග්ලූටන්.

11. ආහාර නරක් වීමට හේතුවන රසායනික සාධකයකි
    (1) ක්ෂුද්‍රජීවීන්. (2) ජලය. (3) වාතය. (4) එන්සයිම.

12. ආහාරවල වර්ධනය වන ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීමට වඩාත් සුදුසු ක්‍රමය වනුයේ මින් කුමක් ද?
    (1) වැඩි වේලාවක් රත්කර ඇසුරුම් කිරීම. (2) අධිශීතකරණයේ අසුරා තැබීම.
    (3) අධික උෂ්ණත්වයට ලක් කර වින් කිරීම. (4) පරිරක්ෂණ කාරක යොදා බෝතල්වල ඇසිරීම.

13. පිටිමෝලි / පේස්ට්‍රි සෑදීම සඳහා තිරිඟු පිටි වඩාත් යෝග්‍ය වීමට හේතුව වනුයේ එහි අඩංගු
    (1) ඩෙක්ස්ට්‍රින් ය. (2) සෙලියුලෝස් ය.
    (3) ඇමයිලෝස් ය. (4) ග්ලූටන් ය.

14. දැවටුමක් යොදා බදිනු ලබන ආහාර වර්ග දෙකකි
    (1) චයිනීස් රෝල් හා මුං කැවුම්. (2) පැන් කේක් හා කොකිස්.
    (3) කොකිස් හා චයිනීස් රෝල්. (4) මුං කැවුම් හා පැන් කේක්.

15. පවුලේ පරිභෝජනය සඳහා ආහාර සකස් කිරීම හා සම්බන්ධව කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - අධිශීතකරණයෙහි තිබූ ආහාර පිටතට ගැනීමෙන් අනතුරුව ඉක්මනින් සකස් කළ යුතුය.

B - පලා වර්ග ඉහළ උෂ්ණත්වයක වැඩි වේලාවක් පිසීම කළ යුතුය.

C - ආහාර සකස් කිරීමේ දී ධාන්‍ය හා මාෂබෝග එකම ආහාර වේලක අඩංගු කිරීම වඩා සුදුසුය.

D - ආහාර පිස ගැනීමෙන් පසුව අයඩීනීකෘත ලුණු එක් කළ යුතු ය.

මේ අතුරින් නිවැරදි කරුණු වනුයේ

(1) A හා B ය. (2) B හා D ය. (3) A, B හා C ය. (4) A, C හා D ය.

16. කේක් වර්ගයක් පිළිස්සීමට පෝරණුව තුළ තැබූ අමාලි එය පිළිස්සී ඇත්දැයි වරින් වර දොර විවෘතකර පරීක්ෂා කළාය. පිළිස්සීමෙන් පසු එහි දක්නට ලැබුණු ලක්ෂණයක් විය හැක්කේ

(1) මතු පිට තද වී තිබීම ය. (2) රසය අඩු බව ය.
(3) බර අඩු වීම ය. (4) මැද බැස තිබීම ය.

17. අපරදිග ක්‍රමයට කෑම මේසය පිළියෙළ කර විධිමත් ආකාරයට පිළිගැන්වීමේ දී අනුගමනය **නොකළ** යුතු ක්‍රියා මාර්ගයක් වනුයේ

(1) වතුර වීදුරුව ආහාර ගන්නා පිඟානට දකුණු පසින් තැබීම ය.
(2) ආහාර ගන්නා හැන්ද හා සුප් හැන්ද පිඟානට දකුණු පසින් තැබීම ය.
(3) ගෑරුප්පුව හා පිහිය පිඟානට වම් පසින් තැබීම ය.
(4) සුප් පිඟාන, ආහාර ගන්නා පිඟාන මත තැබීම ය.

18. ගර්භිණී අවධිය තුළ ඇතිවිය හැකි සුළු ආබාධ තත්ත්වයකි

(1) හිසරදය. (2) මලබද්ධය.
(3) හතිය. (4) උදරයේ වේදනාව.

19. පරිණත ඩිම්බයක් හා ශුක්‍රාණුවක් සංසේචනය වීම සිදුවන්නේ

(1) ඩිම්බ කෝෂ තුළදී ය. (2) පැලෝපීය නාල තුළදී ය.
(3) ගර්භාෂය තුළදී ය. (4) ගර්භාෂ ග්‍රීවය තුළදී ය.

20. ගර්භාෂය තුළ වැඩෙන භ්‍රෑණයාගේ පෝෂණය සඳහා මවගේ රුධිරය මගින් සැපයෙනුයේ

(1) හෝර්මෝන හා කාබන්ඩයොක්සයිඩ් ය. (2) එන්සයිම හා ඔක්සිජන් ය.
(3) කාබන්ඩයොක්සයිඩ් හා පෝෂකපදාර්ථ ය. (4) පෝෂකපදාර්ථ හා ඔක්සිජන් ය.

21. අඩු බර උපතක් ලෙස හැඳින්වෙනුයේ

(1) ග්‍රෑම් 1500 ට වඩා අඩු උපත් බරකි. (2) ග්‍රෑම් 2000 ට වඩා අඩු උපත් බරකි.
(3) ග්‍රෑම් 2500 ට වඩා අඩු උපත් බරකි. (4) ග්‍රෑම් 3000 ට වඩා අඩු උපත් බරකි.

22. නවජ දරුවා ලෙස හඳුන්වනුයේ

(1) උපතට පෙර අවසාන මාසය තුළ දරුවා ය. (2) ඉපදීමට ආසන්න අවස්ථාවේ දරුවා ය.
(3) උපතින් පසු පැය කිහිපයක් තුළ දරුවා ය. (4) උපතේ සිට පළමු මාසය තෙක් දරුවා ය.

23. ප්‍රතිශක්තිකරණ එන්නතක් වන ද්විත්ව එන්නත (DT එන්නත) දරුවකුට ලබා දෙනුයේ

(1) මාස නවය සම්පූර්ණ වූ පසුව ය. (2) මාස දහඅට සම්පූර්ණ වූ පසුව ය.
(3) අවුරුදු දෙක සම්පූර්ණ වූ පසුව ය. (4) අවුරුදු පහ සම්පූර්ණ වූ පසුව ය.

24. පහත සඳහන් එන්නත් අතුරින් කක්කල් කැස්ස වැළැක්වීම සඳහා දිය යුත්තේ කුමන එන්නත ද?

(1) OPV එන්නත (2) MR එන්නත (3) DPT එන්නත (4) BCG එන්නත

25. ළදරුවකුට අතිරේක ආහාර දීම ආරම්භ කළ යුත්තේ වයස

(1) මාස හතරෙන් පසුව ය. (2) මාස හයෙන් පසුව ය.
(3) මාස අටෙන් පසුව ය. (4) මාස දහයෙන් පසුව ය.

26. මුල් ළමාවියේ දරුවකුගේ සංවර්ධනය පිළිබඳව සිසුවකු විසින් ලියන ලද වැකි කිහිපයක් පහත දැක්වේ.

A - චාලක වර්ධනය කෙරෙහි මේරීම වැදගත් වේ.

B - කායික වර්ධනයේ සීඝ්‍ර වේගයක් පෙන්නුම් කරයි.

C - චිත්තවේග ප්‍රකාශනය ඒකාකාරී නොවේ.

D - භාෂා වර්ධනය, බුද්ධි වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි.

මින් නිවැරදි වැකි වනුයේ

(1) A හා C ය. (2) B හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

27. යොවුන්වියට සුවිශේෂී වූ චර්යාමය ලක්ෂණයක් **නොවන්නේ**

(1) විරාගිච්ඡන්දනයයි (2) අනුකරණයයි.
(3) දවල් හීන මැවීමයි. (4) ප්‍රතිශෝධනයයි.

28. පහත දක්වා ඇත්තේ මැසීමේ දී අනුගමනය කරන පියවර කිහිපයකි.

*A* - ගැටයක් යොදා මැස්ම ආරම්භ කිරීම.
*B* - රෙද්දෙහි නූල් තුනක් හෝ හතරක් අල්ලා මැසීම.
*C* - මැස්ම ඇල හැඩයට යෙදීම.
*D* - තොපිටට කොන්වුවක් යොදා නූල තදකර නිම කිරීම.

මෙයින් සිහින් නූල් දුවවීමට අදාළ පියවරක් වන්නේ

(1) *A* ය. (2) *B* ය. (3) *C* ය. (4) *D* ය.

29. ළදරු කමිසය (baby shirt) සඳහා පතරොම් නිර්මාණය කිරීමේ දී පැළු හා වස්ත්‍ර මිනුම් භාවිත කෙරේ. මෙයින් පැළු මිනුම් පමණක් දක්වා ඇති කාණ්ඩය කුමක් ද?

(1) කර ගැඹුර, පපු මිනුම (2) පපු මිනුම, හරස් මිනුම
(3) හරස් මිනුම, කර පළල (4) කර පළල, පපු මිනුම

30. විසිතුරු මැහුම් ක්‍රම පමණක් ඇතුළත් වන කාණ්ඩය මෙයින් කුමක් ද?

(1) ප්‍රංශ ගැට මැස්ම, සැඟිවාටි මැස්ම, සැටින් මැස්ම.
(2) දම්වැල් මැස්ම, පිස්මේන්තු මැස්ම, සන්හාලි මැස්ම.
(3) සැටින් මැස්ම, දම්වැල් මැස්ම, ප්‍රංශ ගැට මැස්ම.
(4) පැහි වාටි මැස්ම, පිස්මේන්තු මැස්ම, සන්හාලි මැස්ම.

31. ළදරු කමිසයක කර අද්දර නිම කිරීමට යෝග්‍ය **නොවන** ක්‍රමයකි

(1) බඳන වාටිය යෙදීම. (2) පයිපින් කිරීම.
(3) සිප්පි වාටිය යෙදීම. (4) ඇඹරුම් වාටිය යෙදීම.

32. මුට්ටුවක් මැසීමේ දී අනුගමනය කළ ප්‍රධාන පියවර පහත දක්වා ඇත.

- රෙදි කැබලි දෙකෙහි හොඳපිට මුහුණට මුහුණලා තබා සිහින් නූල් දුවවීම.
- මුට්ටුවට පාසු වූ එක් අද්දරකින් අඩක් කපා ඉවත් කිරීම.
- කැපූ අද්දර වැසෙන සේ අනෙක් අද්දර නැමීම.
- නැමූ අද්දර මත වාටි මැස්ම යෙදීම.

මෙම පියවර අනුගමනය කර මසනු ලබන්නේ

(1) සරල මුට්ටුවයි. (2) අතිච්ඡාදන මුට්ටුවයි.
(3) ප්‍රංශ මුට්ටුවයි. (4) පැතලි මුට්ටුවයි.

33. මුට්ටුවක නොමැසූ අද්දර නිම කිරීම සඳහා යොදනු ලබන මැහුම් ක්‍රමයකි

(1) පිස්මේන්තු මැස්ම. (2) බ්ලැන්කට් මැස්ම.
(3) පැහි වාටි මැස්ම. (4) බොත්තම් කාජ මැස්ම.

34. ළදරු කමිසයක විවරය පියවීම සඳහා සුදුසු ක්‍රම දෙකකි

(1) රිබන් ඇල්ලීම හා කෝඩ් ඇල්ලීම. (2) සැනගාංචු ඇල්ලීම හා ටේප් ඇල්ලීම.
(3) ටේප් ඇල්ලීම හා රිබන් ඇල්ලීම. (4) සැනගාංචු ඇල්ලීම හා කෝඩ් ඇල්ලීම.

35. රෙද්දකින් ඇඳුමක් කැපීමට පෙර, එහි විකර්ණාකාර දෙකෙළවරින් ඇද, උණුසුම් ස්ත්‍රික්කයකින් මදිනු ලැබිය. මෙහි අරමුණ වනුයේ

(1) රෙද්දෙහි ඇද ඉවත් කර ගැනීම ය. (2) මැසීම පහසු කර ගැනීම ය.
(3) රෙද්දෙහි කැද ඉවත් කර ගැනීම ය. (4) සිනිඳු මතුපිටක් ලබා ගැනීම ය.

36. පවුල් තුළ දක්නට ලැබුණු ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.

*A* - තීරණ ගැනීමේ දී අපහසුතා ඇතිවීම.
*B* - වැඩි ස්වාධීනත්වයකින් කටයුතු කළ හැකි වීම.
*C* - පරම්පරා අතර මත ගැටුම් ඇති වීම.
*D* - සාරධර්ම වර්ධනයට රුකුලක් වීම.


මෙයින් විස්තෘත පවුලකට සුවිශේෂී ලක්ෂණ දක්වෙනුයේ

(1) *A, B, C* වලිනි. (2) *B, C, D* වලිනි. (3) *A, B, D* වලිනි. (4) *A, C, D* වලිනි.

37. මේවායින් මානව නොවන සම්පත් වනුයේ
   (1) දේපළ, ආකල්ප හා කාලය ය.  (2) කාලය, ඉඩකඩ හා මුදල් ය.
   (3) මුදල්, ශ්‍රමය හා ඉඩකඩ ය.  (4) දැනුම, කුසලතා හා දේපළ ය.

38. නිවසක බිම් සැලසුමක් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව සිසු කණ්ඩායමක් ඉදිරිපත් කළ කරුණු පහත දක්වේ.
   $A$ - පරිමාණයට ඇඳ ඇත.
   $B$ - ඇතුළත හා පිටත බිත්ති ඝනකමින් අසමාන වේ.
   $C$ - දොරවල උස හා පළල පෙන්නුම් කර ඇත.
   $D$ - වාතකවුළු සහ ෆැන්ලයිට්වල පිහිටීම සලකුණු කර ඇත.
   මෙයින් නිවැරදි කරුණු වනුයේ
   (1) $A$ හා $B$ ය.  (2) $B$ හා $C$ ය.  (3) $C$ හා $D$ ය.  (4) $A$ හා $D$ ය.

39. නිවෙස් කිහිපයක දක්නට ලැබුණු, නිදන කාමර හතරක බිම් සැලසුම් පහත දක්වේ. මේවායින් වඩාත් සුදුසු බිම් සැලසුම කුමක් ද?



(1) (2) (3) (4)

40. උපාංගයක් වන උස් වූ විසිතුරු බඳුනක් තැබීම සඳහා වඩාත් ම සුදුසු ස්ථානය වනුයේ
   (1) උසින් වැඩි ටීපෝවක් මත ය.  (2) උසින් අඩු ටීපෝවක් මත ය.
   (3) උසින් වැඩි බිත්ති මුල්ලක ය.  (4) උසින් අඩු බිත්ති මුල්ලක ය.


* *

2.1.3 **I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**


| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 3 |
| 02. | 3 | 22. | 4 |
| 03. | 2 | 23. | 4 |
| 04. | 1 | 24. | 3 |
| 05. | 4 | 25. | 2 |
| 06. | 4 | 26. | 1 |
| 07. | 2 | 27. | 4 |
| 08. | 1 | 28. | 2 |
| 09. | 4 | 29. | 3 |
| 10. | 1 | 30. | 3 |
| 11. | 4 | 31. | 2 |
| 12. | 3 | 32. | 4 |
| 13. | 4 | 33. | 2 |
| 14. | 1 | 34. | 3 |
| 15. | 4 | 35. | 1 |
| 16. | 4 | 36. | 4 |
| 17. | 3 | 37. | 2 |
| 18. | 2 | 38. | 1 |
| 19. | 2 | 39. | 1 |
| 20. | 4 | 40. | 3 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.**

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (විෂය ක්ෂේත්‍ර අනුව)




| ප්‍රශ්න අංකය | විෂය ක්ෂේත්‍ර | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|---|
| 1 - 17 | ආහාර හා පෝෂණය | 15 (76%) | 12 (17%) |
| 18 - 25 | ළමා සංවර්ධනය | 19 (74%) | 23 (18%) |
| 26 - 35 | රෙදිපිළි තාක්ෂණය | 35 (64%) | 26 (24%) |
| 36 - 40 | ගෘහ කළමනාකරණය | 37 (63%) | 38 (29%) |




1 පත්‍රයට අදාළ තේමා හතරෙන් වැඩිම පිරිසකට පහසු වී ඇත්තේ ගෘහ කළමනාකරණය ආශ්‍රිත ප්‍රශ්න කොටසයි. එහි පහසුතාව 62%කි. රෙදිපිළි තාක්ෂණය ආශ්‍රිත විෂය කොටස් සඳහා පහසුතාව 32%ක් වන අතර, එම විෂය කොටස සිසුන්ට වඩාත් අපහසු වී ඇත. ආහාර හා පෝෂණය සඳහා 47%ක පහසුතාවක් දක්වා ඇති අතර, ළමා සංවර්ධනය ආශ්‍රිත ප්‍රශ්න සඳහා 38%ක පහසුතාවක් දක්වා ඇත.

2.1.5 බහුවරණ ප්‍රශ්න සඳහා එක් එක් වරණයට ප්‍රතිචාර - ප්‍රතිශතයක් ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 |
| 1 | 2 | 34% | 38% | 15% | 13% |
| 2 | 3 | 3% | 13% | 70% | 14% |
| 3 | 2 | 21% | 48% | 20% | 11% |
| 4 | 1 | 47% | 28% | 16% | 9% |
| 5 | 4 | 19% | 23% | 6% | 52% |
| 6 | 4 | 6% | 13% | 10% | 71% |
| 7 | 2 | 19% | 64% | 11% | 6% |
| 8 | 1 | 23% | 10% | 26% | 41% |
| 9 | 4 | 47% | 9% | 8% | 36% |
| 10 | 1 | 32% | 38% | 21% | 9% |
| 11 | 4 | 31% | 5% | 4% | 60% |
| 12 | 3 | 13% | 28% | 17% | 42% |
| 13 | 4 | 9% | 37% | 22% | 32% |
| 14 | 1 | 53% | 9% | 25% | 13% |
| 15 | 4 | 6% | 10% | 8% | 76% |
| 16 | 4 | 25% | 13% | 8% | 54% |
| 17 | 3 | 19% | 11% | 22% | 42% |
| 18 | 2 | 11% | 30% | 14% | 37% |
| 19 | 2 | 11% | 74% | 11% | 4% |
| 20 | 4 | 10% | 11% | 11% | 68% |
| 21 | 3 | 57% | 11% | 26% | 6% |
| 22 | 4 | 4% | 5% | 25% | 66% |
| 23 | 4 | 39% | 17% | 26% | 18% |
| 24 | 3 | 9% | 12% | 34% | 45% |
| 25 | 2 | 15% | 65% | 11% | 9% |
| 26 | 1 | 24% | 26% | 37% | 13% |
| 27 | 4 | 24% | 9% | 26% | 41% |
| 28 | 2 | 52% | 25% | 9% | 14% |
| 29 | 3 | 15% | 31% | 28% | 26% |
| 30 | 3 | 5% | 40% | 50% | 5% |
| 31 | 2 | 14% | 27% | 21% | 38% |
| 32 | 4 | 22% | 21% | 18% | 39% |
| 33 | 2 | 27% | 38% | 23% | 12% |
| 34 | 3 | 23% | 13% | 52% | 12% |
| 35 | 1 | 64% | 16% | 8% | 12% |
| 36 | 4 | 17% | 9% | 16% | 58% |
| 37 | 2 | 10% | 63% | 15% | 12% |
| 38 | 1 | 29% | 9% | 13% | 49% |
| 39 | 1 | 60% | 11% | 14% | 15% |
| 40 | 3 | 6% | 30% | 35% | 29% |

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

**2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ථ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

- **නිවැරදි වරණ තෝරා ගැනීමේදී දුර්වල සාධන මට්ටම් පෙන්නුම් කර ඇති ප්‍රශ්න පිළිබඳව විග්‍රහයක් පහත දක්වා ඇත. එහි, දුර්වලතා පෙන්වීමට හේතුවිය හැකි කරුණු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා අන්තර්ගත කර ඇත.**

★ පළමුවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 2වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 38%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 34% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. සංතෘප්ත හා අසංතෘප්ත මේද අම්ල සුවිශේෂීව වෙන්කර හඳුනාගැනීමේ හැකියා අඩුවීම එයට හේතුවකි. සුවිශේෂී වෙනස පිළිබඳ අවබෝධය ලබා දිය යුතු වේ. මෙහිදී මේදමය ආහාරවල අඩංගු මේද අම්ල වර්ගීකරණය, චාට් සටහන් ඇසුරින් පැහැදිලි කිරීම සුදුසු වේ.

★ අටවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 1වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 23%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 41% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 26% ප්‍රතිශතයක් ද තෝරාගෙන ඇත. ආහාරවල අඩංගු ප්‍රෝටීන් ප්‍රතිශතය පිළිබඳව නිශ්චිත දැනුමක් නොමැති බව පෙනේ. ප්‍රෝටීන්වල ගුණාත්මක බව පිළිබඳව විශ්ලේෂණ හැකියාව නොමැති බව ද පැහැදිලිව පෙන්නුම් කෙරේ. ආහාරයන්හි අඩංගු ප්‍රෝටීන්වල ගුණාත්මත බව කෙරෙහි බලපාන කරුණු සුවිශේෂීව අවබෝධ කරවීම අවශ්‍ය වේ.

★ නමවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 4වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 36%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 47% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. විටමින් හා ඛනිජවල කෘත්‍ය පිළිබඳව අවබෝධය ප්‍රමාණවත් නොවන බව පෙනේ. විටමින් හා ඛනිජ නම් කර, ඒවායේ කෘත්‍ය සරල ලෙස අදාල දෘෂ්‍යාධාර භාවිත කරමින් පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

★ දහවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 1වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 32%කි. 2වන වරණය නිවැරදි වරණය ලෙස 38% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 21% ප්‍රතිශතයක් ද තෝරාගෙන ඇත. ශාකමය හා සත්ව ප්‍රභවයන්හි අඩංගු ප්‍රෝටීන් වර්ග පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනේ. මෙහිදී ප්‍රෝටීන් බහුල ආහාර ප්‍රභවයන් උදාහරණ ලෙස දක්වමින් ඒ එකිනෙකෙහි අඩංගු ප්‍රෝටීන් වර්ග පිළිබඳව සිසුන් දැනුවත් කිරීම වැදගත් වේ.

★ දොළොස්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 3වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 17%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 42% ප්‍රතිශතයක් ද, 2වන වරණය නිවැරදි වරණය ලෙස 28% ප්‍රතිශතයක් ද, 1වන වරණය නිවැරදි වරණය ලෙස 13% ප්‍රතිශතයක් ද තෝරාගෙන ඇත. මෙයින් පැහැදිලි වනුයේ පරිරක්ෂණයේදී ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීමට යොදා ගන්නා ක්‍රම, උපක්‍රම හා මූලධර්ම පිළිබඳ දැනුම, අවබෝධය හා භාවිතය යන ප්‍රජාණන හැකියාවන් ගේ දුර්වල බවයි. මෙම හැකියාවන් ඉස්මතු කරලීම සඳහා විවිධ පරිරක්ෂණ ක්‍රම උදාහරණ ලෙස දක්වමින් ඒවායේදී ඉවහල්වන උපක්‍රම හා මූලධර්ම පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතු වේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් දැනුම තහවුරු කිරීම වඩාත් යෝග්‍ය වේ.

★ දහතුන්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 4වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 32%කි. නිවැරදි වරණය 2වන වරණය ලෙස 37% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 22% ප්‍රතිශතයක් ද, 1වන වරණය නිවැරදි වරණය ලෙස 9% ප්‍රතිශතයක් ද තෝරාගෙන ඇත. පිටිමෝලියක අපේක්ෂිත වයනය ලබා ගැනීමට ඉවහල්වන තිරිඟු පිටිවල අඩංගු සුවිශේෂි සංයෝගය පිළිබඳ දැනුවත් බවක් නොමැති වීම මෙයට හේතු වී ඇත. අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලදී කරනු ලබන නිරීක්ෂණ තුළින් මෙම කරුණු තහවුරු කිරීම වැදගත් වේ.

★ දහහත්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 3වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 22%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 42% ප්‍රතිශතයක් ද, 1වන වරණය නිවැරදි වරණය ලෙස 19% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත. මෙහිදී ආහාර පිළිගැන්වීම පිළිබඳ නිරූපණය මගින් සිසුනට ප්‍රායෝගික කුසලතා ලබා දීමේ වැදගත්කම අවධාරණය වේ. ක්ෂේත්‍ර චාරිකා තුළින් මෙහිදී ඉගෙනුම් අත්දැකීම් ලබා දීම වඩාත් ඵලදායී වේ.

★ දහඅටවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 2වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 30%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 37% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. ඉතාම සරල ප්‍රශ්නයක් වුවද, ගර්භණී අවධියේදී ඇතිවිය හැකි සුළු ආබාධ හා වෛද්‍යාධාර ලබා ගත යුතු තත්ත්ව මොනවාද යන්න වෙන්කර හඳුනාගැනීමට නොහැකි වීම ඊට හේතු වේ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු ලවා ගර්භණී අවධිය පිළිබඳව දේශන පැවැත්වීම, මාතෘ සායනයක් නැරඹීමට අවස්ථාව සැලසීම, පෝස්ටර් චාට් වැනි ඉගෙනුම් ආධාරක යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වැදගත් වේ.

★ විසිඑක්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 3වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 26%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 57% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. දැනුම ඇසුරින් පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයක් වුව ද සාධන මට්ටම ඉතා දුර්වලය. දරුවකුගේ උපත් බර පිළිබඳව දැනුවත් නොවීම මීට හේතු වන්නට ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙවැනි කරුණු ඉස්මතු කරමින් පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

★ විසිතුන්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 4වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 18%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 39% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 26% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන් හා අදාල වරින්වර කරනු ලබන සංශෝධන පිළිබඳව විවිධ මාධ්‍ය තුළින් ජනතාව දැනුවත් කරනු ලබයි. ඒ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නැති බව පෙනේ. මෙවැනි කරුණු පිළිබඳව සිසු දැනුම යාවත්කාලීන කිරීම වැදගත් වේ.

★විසිහතරවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 3වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 34%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 45% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. මෙයට ද හේතු වී ඇත්තේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන පිළිබඳව අවධානය යොමු නොවීමය. සිසු දැනුම යාවත්කාලීන කිරීම වැදගත් වේ.

★ විසිහයවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 1වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 24%කි. 3වන වරණය නිවැරදි වරණය ලෙස 37% ප්‍රතිශතයක් ද, 2වන වරණය නිවැරදි වරණය ලෙස 26% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත. මුල් ළමා විය සංවර්ධනයේ විවිධ වර්ධනයන් හා අදාළ විෂය කරුණු පිළිබඳ අවබෝධය දුර්වල බව පැහැදිලි වේ. න්‍යායාත්මක කරුණු පමණක් ඉදිරිපත් කිරීමට සීමා නොවී, මුල් ළමාවිය දරුවන් පිළිබිඹු කරන වර්ධනයන් සිසුන්ට නිරීක්ෂණය කිරීමට අවස්ථාව සැලසීම තුළින් එම කරුණු වටහාගැනීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම වැදගත් වේ.

★ විසිඅටවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 2වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 25%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 52% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. රෙදිපිළි තාක්ෂණය යටතේ එන මූලික මැහුමක්‍රම පිළිබඳ ප්‍රායෝගික කුසලතා නොමැතිවීම මීට හේතු වී ඇත. මූලික මැහුම්ක්‍රම පිළිබඳ නියැදි හා ඒවා මැසීමේ පියවර පිළිබඳ රූපසටහන් ඇසුරින් පැහැදිලි කර අනතුරුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා දිය යුතුය.

★ විසිනවවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 3වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 28%කි. 2වන වරණය නිවැරදි වරණය ලෙස 31% ප්‍රතිශතයක් ද, 4වන වරණය නිවැරදි වරණය ලෙස 26% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත. ළදරු කමීසය නිර්මාණයේදී භාවිතවන මිනුම් මොනවාදැයි යන්න පිළිබඳව නොදැනුවත් බව හා ඒවා ඍජු හා වක්‍ර මිනුම් ලෙස වෙන් කර හඳුනාගැනීමට නොහැකි බවත් මීට හේතු වේ. දෘෂ්‍යාධාර භාවිතයෙන් ළදරු කමිසය නිර්මාණයේදී වැදගත්වන ඍජු හා වක්‍ර මිනුම් හඳුනාගැනීමට අවස්ථාව සැලසීම වැදගත් වේ.

★ තිස්එක්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 2වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 27%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 38% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 21% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත.

★ තිස්දෙවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 4වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 39%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 22% ප්‍රතිශතයක් ද, 2වන වරණය නිවැරදි වරණය ලෙස 21% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 18% ප්‍රතිශතයක් ද තෝරාගෙන ඇත.

★ තිස්තුන්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 2වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 38%කි. 1වන වරණය නිවැරදි වරණය ලෙස 27% ප්‍රතිශතයක් ද, 3වන වරණය නිවැරදි වරණය ලෙස 23% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත.

31, 32 හා 33 යන ප්‍රශ්න, මූලික මැනුම් ක්‍රම හා මැසීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ කුසලතා ඇගයීමට සකස් කර තිබුණ ද, ඒවායේ සාධන මට්ටම ඉතාමත් ම දුර්වලය. මීට හේතු වනුයේ ඊට අදාළ කුසලතා ප්‍රගුණ කිරීමට උත්සාහ නොකිරීමයි. සිසුන් පෙළඹවීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී ඵලදායී උපාය මාර්ග ගැනීම කෙරෙහි ගුරුවරුන්ගේ අවධානය යොමු කිරීම වැදගත් වේ.

★ තිස්අටවන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 1වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 29%කි. 4වන වරණය නිවැරදි වරණය ලෙස 49% ප්‍රතිශතයක් තෝරාගෙන ඇත. අඳින ලද බිම් සැලසුම් නිරීක්ෂණය කිරීම හා බිම් සැලසුම් ඇඳීමට සිසුන් යොමු නොකිරීම මෙයට හේතු වේ. අඳින ලද බිම් සැලසුම් කිහිපයක් නිරීක්ෂණය කිරීමට සිසුන් ට අවස්ථාව ලබා දී, ඒ පිළිබඳ පැහැදිලි කර සහ සිසුන් ලවා සරල බිම් සැලැසුම් ඇඳීමට සැලැස්වීමෙන් ඉගෙනුම් අත්දැකීම් තහවුරු වනු ඇත.

★ හතලිස්වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය 3වන අතර, එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 35%කි. 2වන වරණය නිවැරදි වරණය ලෙස 30% ප්‍රතිශතයක් ද, 4වන වරණය නිවැරදි වරණය ලෙස 29% ප්‍රතිශතයක් ද, තෝරාගෙන ඇත. නිවසක භෞතික සංවිධානයේදී වැදගත්වන ප්‍රායෝගික කරුනු උචිත ලෙස අදාළ කර ගැනීම නොහැකි වීමේ දුර්වලතාවය මෙයට හේතු වී ඇත. සිසුන් තුළ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 2,3,4,5,6,7,11,14,15,16,19,20,22,25,27,30,34,35,36,37 සහ 39 යන ප්‍රශ්නවලට සිසුන් දී ඇති පිළිතුරු ඇගයීමේදී අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වී ඇති බව හෝ එම මට්ටමට පැමිණ ඇති බැව් සනාථ විය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* ප්‍රශ්න 7කින් යුක්ත ය. කාලය පැය 02කි.

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ කොටස් 10කින් සමන්විත වේ. එක් කොටසකට ලකුණු 02ක් බැගින් මුළු ලකුණු 20කි.

* සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 40 = 60

II පත්‍රයේ අවසන් ලකුණු = 60

## 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

★ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3 සහ 4 ඇසුරින් සකස් කර ඇත.

### 1 ප්‍රශ්නය

1. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පාසලක ගෘහ ආර්ථික විද්‍යා දිනය සැමරීම සඳහා උත්සවයක් පැවැත්වීම වාර්ෂික වැඩ සැලැස්මෙහි ඇතුළත් ව ඇත. ඒ නිමිත්තෙන් ප්‍රදර්ශනයක් ද පැවැත්වීමට තීරණය විය. මෙම කාර්යය 10 සහ 11 ශ්‍රේණිවල ගෘහ ආර්ථික විද්‍යාව හදාරන සිසුන්ට පැවරිණි.
මෙහිදී ප්‍රදර්ශන භාණ්ඩ ඉදිරිපත් කෙරෙනුයේ විෂයට අදාළව සිසුන් ලබා ගත් නිපුණතා එළි දැක්වීම අරමුණු කරගෙන ය.
ඒ අතර විශේෂ අමුත්තන් සඳහා සිහිවටනයක් නිර්මාණය කිරීමට ද නියමිත ය.
මෙම උත්සවය සංවිධානය කර ගැනීම සඳහා අනු කමිටු පත් කර තිබුණ ද, එය සාර්ථක කර ගැනීම සඳහා සැමගේ සහයෝගය අපේක්ෂිත ය.

(i) උත්සවයෙහි සංග්‍රහය භාර අනු කමිටුව විසින් ගත යුතු පියවර **හතරක්** සඳහන් කරන්න.

(ii) විශේෂ අමුත්තන් සඳහා තිළිණ කරන සිහිවටනය ලෙස උපාංගයක් නිර්මාණය කිරීමට
- තනි පැහැති රෙදි කැබලි
- මුද්‍රිත රෙදි කැබලි
- විවිධ වර්ණවල නූල් සහ නූල් කැරලි සපයා ඇත.

මෙම ද්‍රව්‍ය භාවිත කරමින් සකස් කළ හැකි උපාංගයක් නම් කර, ඒ සඳහා සුදුසු මෝස්තරයක් ගොඩ නගන්න.

(iii) විශේෂ අමුත්තන්ගේ සංග්‍රහය සඳහා බොජුන් පත සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iv) සංග්‍රහය පිළිගැන්වීම කරනු ලබන්නේ ස්වයං-සේවා ක්‍රමයට ය. ස්වයං-සේවා ක්‍රමය හඳුන්වන්න.

(v) සිසුන්ට සංග්‍රහ කිරීම සඳහා සුළු කෑම වර්ග තුනක් ඇතුළත් ආහාර බැගයක් බැගින් දීමට තීරණය විය. එම ආහාර බැගය සකස් කිරීමේ දී අවධාරණය කළ යුතු කරුණු **දෙකක්** ලියන්න.

(vi) 'පරිරක්ෂිත ආහාර' තේමාව යටතේ ද ප්‍රදර්ශන භාණ්ඩ ඉදිරිපත් කිරීමට අදහස් කර ඇත. මෙහිදී පලතුරු පරිරක්ෂණය සඳහා යොදා ගැනෙන පරිරක්ෂණ කාරක **දෙකක්** නම් කරන්න.

(vii) භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා ශාලාව සංවිධානය කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **හතරක්** දක්වන්න.

(viii) ප්‍රදර්ශනයෙහි ළමා සංවර්ධනය ක්ෂේත්‍රයට අදාළව නිර්මාණය කිරීමට අදහස් කෙරෙන 'සෙල්ලම් ගෙය', කුඩා දරුවන්ට ආකර්ෂණීය වීම නොඅනුමානය. මුල් ළමා විය දරුවාගේ සංවර්ධනය කෙරෙහි 'සෙල්ලම් ගෙය' ඉවහල් වන අයුරු දැක්වීමට කරුණු **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ix) උත්සවයෙහි සාර්ථකත්වය සඳහා ඉවහල් වන, යොවුන්වියේ දරුවන් සතු සුවිශේෂී ගති ලක්ෂණ **දෙකක්** ලියන්න.

(x) මෙම කාර්යය එලදායී කර ගැනීමෙහි ලා ගෘහ ආර්ථික විද්‍යාව හදාරන සිසුන් ප්‍රගුණ කළ නිපුණතා බොහෝ සෙයින් ඉවහල් වේ. එබඳු නිපුණතා **දෙකක්** සඳහන් කරන්න.

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i)
- සහභාගී වන සංඛ්‍යාව ගැන දැනුවත් වීම.
- බොජුන්පත තීරණය කිරීම.
- වැයවන මුදල් ගණන් බැලීම.
- අමුද්‍රව්‍ය සපයා ගැනීම.
- අවශ්‍ය ගෘහ භාණ්ඩ, මෙවලම්, උපකරණ සපයා ගැනීම.
- පිළියෙල කිරීම, පිසීම පිළිබඳ සැලසුම් කිරීම.
- පිළිගැන්වීම සැලසුම් කිරීම.
- යථාවත් කිරීම.

**(කරුණු 4ට ලකුණු 2යි)**

(ii)
- බිත්ති සැරසිල්ලක්
- අත්පිස්නා රඳවනය
- මේස දරණු
- අත්පිස්නා
- ශීතකරණ දොර අල්ලු
- කුෂන් කවර
- මල් කළඹ
- Centre - piece

**(නම් කිරීමට ලකුණු 1/2යි)**

- නිර්මාණය රූප සටහනකින් ඉදිරිපත් කිරීම.
- මෝස්තරයේ උචිත බව.
- යොදා ගන්නා මැහුම් ක්‍රම.
- සඳහන් කර ඇති ද්‍රව්‍ය භාවිතා කර තිබීම.

**(ලකුණු 1 1/2යි)**

(iii)
- අමුත්තන් සංඛ්‍යාව
- සංග්‍රහය පවත්වනු ලබන වේලාව
- විවිධත්වය
- ආහාර වර්ගවල ගැළපීම
- අලංකාරය
- රුචිකත්වය

**(කරුණු 4ට ලකුණු 02යි)**

(iv) ඉඩකඩ අඩු අවස්ථාවක වැඩි අමුත්තන් සංඛ්‍යාවක් සඳහා ආහාර බෙදා ගන්නා අනුපිළිවෙල අනුව දීසි තැන්පත් කර, තමා විසින්ම තම කැමැත්ත අනුව ආහාර තොරා ගෙන, මේසයෙන් පිටත වාඩි වී ආහාර ගැනීමට සැලසුම් කිරීම.

**(ලකුණු 02යි)**

(v)
- සුදුසු ඇසුරුමක බහා පිළිගැන්වීම (පරිසරයට හානිදායක නොවන)
- එකිනෙක ආහාර වෙන් වෙන්ව දවටන වල යොදා තැබීම.
- වයනය වෙනස් නොවන සේ ආකාරයට ඇසිරීම.
- ඇසුරුම නිර්මාණශීලී අලංකාර එකක් වීම.

**(කරුණු 4ට ලකුණු 02යි)**

(vi)
- සීනි
- විනාකිරි
- ලුණු
- සිට්රික් අම්ලය
- සෝඩියම් මෙටාබයිසල්ෆයිට්
- පොටැසියම් මෙටාබයිසල්ෆයිට්
- සෝඩියම් බෙන්සෝඒට්
- පොටැසිටම් බෙන්සෝඒට්
- බෙන්සොයික් අම්ලය

**(කාරක 2ට ලකුණු 02යි)**

(vii)
- ශාලාව පිරිසිදු කිරීම.
- ප්‍රදර්ශන භාණ්ඩ සැලසුම් කිරීම.
- ගමන් මාර්ග සැලසුම් කිරීම
- ප්‍රදර්ශන භාණ්ඩ ලේබල් කිරීම, ගොනු කිරීම.
- ප්‍රදර්ශන භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කිරීම.
- අදාල පෝස්ටර්,චාට්ස් ස්ථාන ගත කිරීම.
- ආලෝකය හා වාතාශ්‍රය නිසි ලෙස ලැබීම පිළිබඳව සොයා බැලීම.

**(කාරක 4ට ලකුණු 02යි)**

(viii)
- චාලක වර්ධනය - සෙල්ලම් ගෙය තුළ ක්‍රියාශීලි බව
- බුද්ධි වර්ධනය - නිර්මාණශීලි බව<br>සංකල්ප සාධනය
- සමාජ සංවර්ධනය - සාමුහික බව<br>අදහස් හුවමාරුව
- භාවිත වර්ධනය - සතුට<br>ඉවසීම
- භාෂා වර්ධනය - අලුත් වචන එකතු කිරීම<br>උච්චාරණය

**(කරුණු 2ට ලකුණු 02යි)**

(ix)
- සහයෝගිතාවය
- ක්‍රියාශීලී බව
- නායකත්ව ලක්ෂණ
- තරගකාරී බව
- වගකීම භාර ගැනීමට ඇති කැමැත්ත
- කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට ඇති කැමැත්ත
- නිර්මාණශීලි බව

**(කරුණු 2ට ලකුණු 02යි)**


(x) අයදුම්කරුගේ පිළිතුරට අනුව

- ප්‍රදර්ශන භාණ්ඩවලට අදාළ නිපුණතා
  උදා:- රිවි ඇඳුම - කුඩා ළමුන්ගේ ඇඳුම් නිර්මාණය පිළිබඳව කුසලතාව
- පරිරක්ෂිත ආහාර - පරිරක්ෂණයට අදාල නිපුණතා
- ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන නිපුණතා
  - සමාජ කුසලතා
  - පෞද්ගලික කුසලතා
  - මානසික කුසලතා

(කරුණු 2ට ලකුණු 2යි)


මුළු ලකුණු 20යි

**01වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන :**




පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර, ඊට 100%ක්ම පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 46%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ට වඩා ලබාගත් පිරිස 4%ක් පමණ වන අතර, 29%ක් පමණ සිසුන් ලබාගෙන ඇත්තේ ලකුණු 5ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 10ක් ඇති අතර පහසුතාව 40%ට වැඩි අනු කොටස් 7කි. ඉතිරි අනු කොටස් 3හි පහසුතාව 40%ට අඩුය. පහසුතාව අඩුම අනු කොටස v වේ. එහි පහසුතාවය 22%කි.

★ iv වෙනි අනු කොටසේ පිළිගැන්වීමෙහි ස්වයං සේවා ක්‍රමය පිළිබඳ දැනුම ආශ්‍රිත ප්‍රශ්නය වුවත්, මෙහි පහසුතාව 28%කි. ඉන් හැගෙනුයේ මෙහි විෂය කරුණු පිළිබඳව ඇති දැනුම සිසුන් තුළ ප්‍රමාණවත් නොවීමය. පිළිගැන්වීමේ ක්‍රම ස්වයං සේවා ප්‍රදර්ශන, ක්ෂේත්‍ර චාරිකා, ඇසුරෙන් දැනුවත් කිරීම් කළ යුතුය.

★ v වෙනි අනු කොටසෙහි පහසුතාව 22%කි. ආහාර බෑගයක් ඇසුරුම් කිරීමේදී අවධාරණය කළ යුතු කරුණු පිළිබඳව වැටහීමක් නොමැති බව මින් පෙනී යයි. මෙහිදී සුළු ආහාර වර්ග කිහිපයක් සකස් කර, ඒවා ඇසුරුම් කරන අයුරු ක්‍රමානුකූලව ආදර්ශනය කිරීම තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබාදීම යෝග්‍ය වේ.

★ vi වෙනි අනු කොටසට ලබා ඇති පහසුතාව 26%කි. ආහාර පරිරක්ෂණයේදී භාවිත කරන කාරක පිළිබඳව නිසි වැටහීමක් ලබා නොමැත. ආහාර පරිරක්ෂණය කිරීමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් පරිරක්ෂණ කාරක හඳුනාගැනීමට අවස්ථාව සැලසීම වැදගත් වේ.

## 02 ප්‍රශ්නය

**2.** **(i)** **කුෂන් කවරයක් මැසීමේ දී අනුගමනය කළ යුතු පියවර සඳහන් කරන්න.**

**(ii)** **රිවි ඇඳුම නිර්මාණයේ දී, මැසීමේ ශිල්පීය ක්‍රම භාවිත වේ. එම ශිල්පීය ක්‍රම තුනක්,** ඒවා යොදනු ලබන ස්ථාන **සමග දක්වන්න.**

**(iii)** **(a)** **රිවි ඇඳුමෙහි කඳ කොටස විසිතුරු කිරීම සඳහා යොදගත හැකි ක්‍රම දෙකක්** නම් කරන්න.

**(b)** **ඉන් එක් ක්‍රමයක් මගින්** රිවි ඇඳුමෙහි කඳ කොටස විසිතුරු කෙරෙන ආකාරය විස්තර කරන්න.

### පේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(2) (i)
- කුෂන් කවරයේ මතුපිට විසිතුරු කරන්නේ නම් මෝස්තරය මසා නිම කිරීම.
- යොදනු ලබන ක්‍රමය අනුව පොරුවක් යෙදීම.
- කුෂන් කවරයෙහි විවරය මැසීම.
- ඉදිරිපස හා පිටුපස මූට්ටු කිරීම.
- මූට්ටු අද්දර නිම කිරීම.
- විවරය පියවීම සඳහා උචිත ක්‍රමයක් අනුගමනය කිරීම.

**(කරුණු 3ට ලකුණු 03යි)**

(ii)

| | | |
|---|---|---|
| • පැතලි මූට්ටුව<br>විවරය යෙදීම } | - | අංශය සඳහා |
| • බොත්තම් කාස මැසීම | - | රිවි ඇඳුමේ කඳට |
| • විකර්ණාකාර පටි අල්ලා<br>ඉලාස්ටික් ඇමීම } | - | රිවි ඇඳුමේ ඉනට |
| • බඳන වාටි, පෝරු වාටි, පයිපින් | - | කඳවටා, කකුල වටා |
| • බ්‍රේඩින්, රැළි පටි, ලේස් (අක් සැරසිලි) | - | කඳවටා, කකුල වටා |

**(කරුණු 3ට ලකුණු 03යි)**

(iii) (a)
- එම්බ්‍රොයිඩර් කිරීම
- ආරෝපණය කිරීම (ඇප්ලික් කිරීම)
- පින්තාරු කිරීම
- මුද්‍රණය කිරීම
- රිබන් වැඩ යෙදීම
- පැච් වර්ක් කිරීම

**(කරුණු 2ට ලකුණු 02යි)**


(b)
- අයදුම්කරුගේ පිළිතුර අනුව

**(රූප සටහන අනුව ලකුණු 01යි)**

**ලකුණු 02යි**


**මුළු ලකුණු 10යි**

## 02වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 26%ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 67%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 3%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ට වඩා ලබාගත් පිරිස 3%ක් පමණ වන අතර, 67%ක් පමණ සිසුන් පිරිසක් ලබාගෙන ඇත්තේ ලකුණු 2ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 10ක් ඇති අතර පහසුතාව 40%ට වැඩි අනු කොටස් 7කි. ඉතිරි අනු කොටස් 3හි පහසුතාව 40%ට අඩුය. පහසුතාව අඩුම අනු කොටස v වේ. එහි පහසුතාවය 22%කි.

- ⋆ මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 26%ක පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ට වඩා ලබා ගත් පිරිස 3%කි. 67%ක ප්‍රතිශතයක් ලකුණු 2ට වඩා අඩුවෙන් ලබා ගෙන ඇත. මේ අනුව වැඩි සිසුන් පිරිසක් ඇත්තේ අඩුම ලකුණු මට්ටමේ බව පැහැදිලි වේ.

- ⋆ i කොටසෙහි පහසුතාව 18%කි. 11 වන ශ්‍රේණියේ පෙළපොතෙහි කුෂන්කවරය මැසීමේ පියවර ඉදිරිපත් කර ඇතත්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් ඉගෙනුම් අත්දැකීම් ලබාදීමක් සිදු නොවී ඇති බව පෙනේ. මෙහිදී ගුරු ආදර්ශනය තුළින් සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට කටයුතු කළ යුතුය.

- ⋆ ii කොටසෙහි පහසුතාව 10%කි. එසේ වී ඇත්තේ මැසීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ කුසලතාව ලබා නොමැති වීමය. රිවි ඇදුම මැසීමේදී ශිල්පීය ක්‍රම අනුගමනය කළ යුතුවේ. එයට පෙර මැසීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ කුසලතා නොමැති දරුවකුට රිවි ඇදුම මැසීමේදී ගැටලු මතු විය හැකිය. එය වළක්වා ගැනීමට මැසීමේදී භාවිත කරන ශිල්පීය ක්‍රම පිළිබඳව හුරුව ලබා දිය යුතුය.

- ⋆ iii කොටසෙහි (a) හා (b) පහසුතාව පිළිවෙලින් 22%ක් හා 23%කි. රිවි ඇදුම මැසීම මෙන්ම එය විසිතුරු කිරීම පිළිබඳව ලබා ඇති අත්දැකීම් අඩු බව පෙනේ. විසිතුරු මැහුම් ක්‍රම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් ප්‍රගුණ කිරීම සහ අවස්ථානුකූලව භාවිතයට ගැනීමේ හැකියාව පුරුදු කළ යුතුය.

## 03 ප්‍රශ්නය

**3.** **(i) ගර්භිණී අවධියේ දී දෛනික ප්‍රෝටීන අවශ්‍යතාව වැඩි කළ යුතු වේ. මීට හේතු වන කරුණු තුනක් දක්වන්න.**

**(ii) මාළු, ධාන්‍යවලට වඩා ඉක්මනින් නරක් වීමට භාජනය වේ. එයට ඉවහල් වන හේතු පැහැදිලි කරන්න.**

**(iii) විශේෂ දිවා ආහාර වේලක් සඳහා සැලසුම් කරන ලද බොජුන් පතක කට්ලට්ස් සහ කැරමල් පුඩිම යන ආහාර ඇතුළත් ව ඇත.**

**(a) මෙම ආහාර වර්ග දෙක සකස් කිරීමේ දී යොද ගැනෙන පිසීමේ ක්‍රම නම් කරන්න.**

**(b) ඉහත නම් කළ පිසීමේ ක්‍රමවලදී, එම ආහාරවල මනා නිමාවක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර වෙන් වෙන්ව ලැයිස්තු ගත කරන්න.**

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (i)
- මවගේ ගර්භාෂය තුළ වැඩෙන කළලයේ / භ්‍රෑණයේ පවතින වර්ධනය සඳහා
- වැඩිවන රුධිර පරිමාව සංශ්ලේෂණය සඳහා
- මවගේ ස්තන ග්‍රන්ථීන්ගේ වර්ධනය සඳහා
- ශ්‍රෝණි ප්‍රදේශයේ මාංශ පේෂි වර්ධනය සඳහා
- ගර්භාෂ බිත්තිවල මනා වර්ධනය සඳහා
- පෙකණිවැල හා කළල බන්ධයේ වර්ධනය සඳහා
- ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය සඳහා

**(කරුණු 3ට ලකුණු 03යි)**

(ii)
- මාළුවල අඩංගු ජල ප්‍රතිශතය වැඩි නිසා ක්ෂුද්‍රජීවීන්, විශේෂයෙන් බැක්ටීරියා සීඝ්‍රයෙන් වර්ධනය වේ.
- ධාන්‍ය වලට වඩා මාළු පෝෂකවලින් සරු හෙයින් ක්ෂුද්‍රජීවී වර්ධනයට හිතකර උපස්තරයක් වේ.
- මාළු තැලීම, පොඩිවීම වැනි භෞතික හේතුන්ට පහසුවෙන් භාජනය වීම නිසා

**(මින් එක් කරුණක් පැහැදිලි කිරීමට ලකුණු 03යි)**

(iii) (a)
- කට්ලට්ස් - ගැඹුරු තෙලේ බැදීම, බේක් කිරීම
- කැරමල් පුඩිම - හුමාලයෙන් තැම්බීම/වක්වාෂ්පයෙන් තැම්බීම, බේක් කිරීම

(b)
- කට්ලට්ස් - <u>ගැඹුරු තෙලේ බැදීම</u>

★ දැවටුම යෙදීම
★ ආහාරය වැසෙන සේ තෙල් භාවිතා කිරීම
★ තෙල් හොඳින් රත් කිරීම
★ බැදෙන කට්ලට් වරින් වර හැරවීම
★ රන්වන් පැහැය වනතෙක් බැද ගැනීම
★ බැදීමෙන් අනතුරුව තෙල් බේරා ගැනීම
★ තෙල් පොවන කඩදාසියක් මත දැමීම
★ තෙල් තාච්චියේ පතුලට එකතුවන දැවටුම් පෙරා ඉවත් කිරීම

<u>බේක් කිරීම</u>

★ තැටියේ තෙල් ආලේප කිරීම
★ පෝරණුව පෙර රත් කිරීම
★ නියමිත වේලාව තුළ පිසීම
★ උෂ්ණත්වය පාලනය කිරීම
★ පමණ ඉක්මවා බේක් නොකිරීම

**(එක් ක්‍රමයකට අදාල කරුණු 3ට ලකුණු 1 1/2යි)**

- කැරමල් පුඩිම - හුමාලයෙන් තැම්බීම / වක්වාෂ්පයෙන් තැම්බීම

  - ★ මිශ්‍රනය බඳුනකට දමා තෙල් කඩදාසියකින් වැසීම
  - ★ ස්ටීමරයක් / ජල බඳුන තබා නියමිත කාලයක් තැම්බීම
  - ★ වාෂ්ප පිටවීම වැළැක්වීම
  - ★ මිශ්‍රණය දැමීමට තාප ස්ථායි බඳුනක් භාවිත කිරීම

  බේක් කිරීම


  - ★ පෝරණුව නියමිත උෂ්ණත්වයට රත් කිරීම
  - ★ නියමිත කාලය තුළ පෝරණුවේ පුලුස්සා ගැනීම
  - ★ පිසීමේදී උෂ්ණත්වය පාලනය කිරීම

**(එක් ක්‍රමයට අදාල කරුණු 3ට ලකුණු 1 1/2 යි)**

**ලකුණු 04 යි**


**මුළු ලකුණු 10 යි**

**03වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 65%ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 6%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ට වඩා ලබාගත් පිරිස 6%ක් පමණ වන අතර, 37%ක් පමණ සිසුන් ලබාගෙන ඇත්තේ ලකුණු 2ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 4ක් ඇති අතර, ඉන් අනු කොටස් 2ක පහසුතාව 40%ට වඩා වැඩිය. ඉතිරි කොටස් දෙකෙහි පහසුතාව 34%ට වඩා අඩු අතර, පහසුතාව අඩුම ප්‍රශ්නය (iii) b වේ. එහි පහසුතාවය 26%කි.

★ i කොටසට ලබා ඇති පහසුතාව 34%කි. ගර්භණී මවකට අවශ්‍ය පෝෂණය පිළිබඳව කරුණු දැන සිටිය ද, ප්‍රෝටීන් අවශ්‍යතාවයන්හි අගය වැඩි කිරීමට හේතුවන කරුණු පිළිබඳ අවබෝධය අවම මට්ටමක ඇති බව පැහැදිලි වේ. නිර්දේශිත පෝෂණ අවශ්‍යතා සටහන ඇසුරින් ගර්භණී මවකට වැඩිකළ යුතු පෝෂක හා ඒවා ප්‍රමාණයෙන් වැඩි කිරීමට හේතු වන කරුණු ද විස්තර කිරීම අවශ්‍ය වේ.

★ iii කොටසට (a) (b) ලෙස අනු කොටස් දෙකක් ඇතුළත්ව ඇත. එහි (a) කොටසට සඳහා 65% ක පහසුතාවක් පෙන්වයි. (b) කොටස සඳහා ලබා ඇති පහසුතාව 26%කි. ආහාර සකස් කිරීමේ ප්‍රායෝගික කුසලතා ප්‍රගුණ කර නොමැති බව පිළිතුරුවලින් පිළිබිඹු වේ. ආහාරයේ නිමාව කෙරෙහි පිසීමේ ක්‍රමය බලපාන අයුරු පැහැදිලි කිරීමට නොහැකි වී ඇත. ආහාර සකස් කිරීමේදී අනුගමනය කරන පියවර හඳුනාගැනීම සඳහා ප්‍රායෝගික අත්දැකීම් ලබා දිය යුතුය. මෙහිදී පිසීමේ ක්‍රම, සුවිශේෂීව ආහාරයේ නිමාවට බලපාන අයුරු පැහැදිලි කර දීම ඉතා වැදගත් වේ.

## 04 ප්‍රශ්නය

**4.** අප එදිනෙද ගන්නා ආහාර වේල්වල සංයුතියෙහි ප්‍රධාන පෝෂක වැඩි ප්‍රමාණයක් අඩංගු වේ.

(i) සම්පූර්ණ හා අසම්පූර්ණ ප්‍රෝටීන්වල වෙනස දක්වන්න.

(ii) සිරුර තුළ කාබොහයිඩ්රේට්වලින් ඉටු කෙරෙන කාර්ය **තුනක්** විස්තර කරන්න.

(iii) ආහාර වේල්වල වැඩිපුර මේදය අඩංගු කිරීම සිරුරට අහිතකර ය. සාකච්ඡා කරන්න.

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(4) (i) සම්පූර්ණ ප්‍රොටීන්

අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල සියල්ලම සිරුරට අවශ්‍ය ප්‍රමාණයෙන් අඩංගුව ඇත.

අසම්පූර්ණ ප්‍රෝටීන්

අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල සියල්ලම සිරුරට අවශ්‍ය ප්‍රමාණයෙන් අඩංගු වී නැත

හෝ

අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල කිසිවක් සිරුරට අවශ්‍ය ප්‍රමාණයෙන් අඩංගු වී නැත.


(ලකුණු 03යි)

(ii)
- සිරුරට ශක්තිය ලබා දෙන ප්‍රධාන පෝෂකයයි. කාබෝහයිඩ්‍රේට් ග්‍රෑම් 1කින් කිලෝ කැලරි 4ක් ලබා දෙයි.
- සෙලියුලෝස් මලබද්ධය වළකාලයි.
- ප්‍රෝටීන් පිරිමැසීම සඳහා දායකවෙයි.
- සංචිත කර ගැනීමේ හැකියාව (ග්ලයිකොජන්)
- මොළයේ සෛලවල ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන ශක්තිය ලබා ගැනීම කෙරෙනුයේ ග්ලූකෝස්වලිනි.
- අත්‍යවශ්‍ය නොවන ඇමයිනෝ අම්ල නිෂ්පාදනයට අවශ්‍ය වේ.
- ජීරණය කිරීමේ පහසුව නිසා ඉක්මනින් ශක්තිය ලබා ගත හැකි වේ.

(කරුණු 3ට ලකුණු 03යි)


(iii)
- සිරුරෙහි බර වැඩිවීම ස්ථූලතාවය ඇතිවීමට හේතු වේ.
- හෘද රෝගවලට නැඹුරුවීමේ ප්‍රවණතාවය ඇති වේ.
- සිරුරෙහි අනවශ්‍ය මේදය තැන්පත් වීම නිසා ශරීර හැඩය කෙරෙහි බලපෑම.
- කොලෙස්ටරෝල් ප්‍රමාණය වැඩි වීම.
- ජීරණ අපහසුතා
- ගැස්ට්‍රයිටීස් (ආමාශයික ප්‍රදාහය)

04වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 70%ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 9%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ට වඩා ලබාගත් පිරිස 9%ක් පමණ වන අතර, 38%ක් සිසුන් ලබාගෙන ඇත්තේ ලකුණු 2ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර, (i) හි පහසුතාව 26%ක් වේ. මෙම අනු කොටස පහසුතාවයෙන් අඩුම කොටසයි. (ii) හා (iii) සඳහා පහසුතාව පිළිවෙළින් 45% හා 54% වේ.

★ i කොටසට ලබා ඇති පහසුතාව 28%කි. එසේ වී ඇත්තේ ප්‍රෝටීන් වර්ගීකරණය නිවැරදි ලෙස හඳුනාගෙන නොමැති වීමය. ගුණාත්මකභාවය අනුව ප්‍රෝටීන් වර්ගීකරණය ඉදිරිපත් කර, සම්පූර්ණ හා අසම්පූර්ණ ප්‍රෝටීන් පිළිබඳ වෙනස පෙන්වා දිය යුතුය.

## 05 ප්‍රශ්නය

**5.** (i) **ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කිරීමට හේතු වන කරුණු තුනක්** සඳහන් කරන්න.
(ii) **තෝරාගත් ගෘහ භාණ්ඩ, කාමරයක් තුළ ස්ථානගත කිරීමේදී අවධාරණය කළ යුතු කරුණු තුනක්** පැහැදිලි **කරන්න.**
(iii) **නිවසක් ඉදිකිරීමට සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු හතරක්** විස්තර කරන්න.

**අපේක්‍ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(5) (i)
- පවුලේ සාමාජිකයින් අතර ඇති ආදරය, ගෞරවය, ඉවසීම හා සහයෝගය.
- යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටුකිරීම නිසා පවුලේ සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගීම.
- නිවසෙහි භෞතික සංවිධානයෙහි ක්‍රමවත් බව.
- නිවසෙහි අභ්‍යන්තර හා බාහිර අලංකරණය ප්‍රසන්න වීම.
- නිවසට මනා ආලෝකයක් හා වාතාශ්‍රය ලැබීම. **(කරුණු 3ට ලකුණු 03යි)**

(ii)
- කාමරයෙන් ඉටුවන කාර්යය අනුව ගෘහභාණ්ඩ ස්ථානගත කිරීම.
- ආලෝකය හා වාතාශ්‍රය ලැබීමට බාධා නොවන පරිදි භාණ්ඩ ස්ථානගත කිරීම.
- උස් ගෘහ භාණ්ඩ බිත්තිවලට ආසන්නව ස්ථාන ගත කළ යුතු අතර, බිත්තිවලට හේත්තු වන ලෙස ගෘහ භාණ්ඩ ස්ථානගත නොකිරීම.

- ගමන් මාර්ග අවහිර නොවන ලෙස ගෘහ භාණ්ඩ ස්ථානගත කිරීම.
- නිතර භාවිත වන ගෘහ භාණ්ඩ උදා:- ලියන මේස, පාඩම් මේස, ස්වභාවික ආලෝකය ලැබෙන ලෙස ජනේල ආසන්නයේ තැබීම.
- විශාල ගෘහ භාණ්ඩ පළමුව ස්ථානගත කර, කුඩා භාණ්ඩ පසුව තැන්පත් කිරීම.


**(කරුණු 3ක් පැහැදිලි කිරීමට ලකුණු 03යි)**

(iii)
- පවුලේ සංඛ්‍යාව
- පවුලේ සාමාජිකයින්ගේ අවශ්‍යතා
- පවුලේ සාමාජිකයින්ගේ රුචිකත්වය
- භූමියේ ප්‍රමාණය
- භූමියේ හැඩය හා ස්වභාවය
- අවශ්‍ය පරිදි වාතාශ්‍රය හා ආලෝකය ලබා ගැනීම
- නිර්මාණශීලී බව හා අලංකාරය
- අවට පරිසරයේ ස්වභාවය
- මූල්‍යමය පහසුකම්
- ගොඩනැගිලි ද්‍රව්‍ය සපයා ගැනීම

**(කරුණු 4ක් විස්තර කිරීම ලකුණු 04යි)**


**මුළු ලකුණු 10යි**

## 05වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය වැඩිම පිරිසක් තෝරා ගෙන ඇති අතර, එහි ප්‍රතිශතය 93%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 41%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ට වඩා ලබාගත් පිරිස 19%ක් පමණ වන අතර, 14%ක් සිසුන් ලබාගෙන ඇත්තේ ලකුණු 2ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර, ඉන් අනු කොටස් 3හිම පහසුතාව 48%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (i) වන අතර, එහි පහසුතාව 48%කි. පහසුතාව වැඩිම අනු කොටස (iii) වන අතර, එහි පහසුතාවය 65%කි.

★ i කොටසට ලබා ඇති පහසුතාව 48%කි. එයට හේතුවක් විය හැක්කේ ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කිරීමට හේතුවන කරුණු නිවැරදිව දැක්වීමට අසමත් වීමය. කරුණු ඉදිරිපත් කිරීමේදී නිශ්චිතව දැක්වීමට සිසුන්ගේ ප්‍රකාශන ශක්තිය වර්ධනය කළ යුතු වේ.

## 06 ප්‍රශ්නය

6. (i) පූර්ව ප්‍රසව සංවර්ධනයේ අවධි තුන හඳුන්වන්න.
   (ii) මුල් ළමාවිය සංවර්ධනයේදී පිළිබිඹු කෙරෙන සුවිශේෂී ලක්ෂණ **තුනක්** විස්තර ක‍
   (iii) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ට සපයනු ලබන
      (a) සීසෝව (b) වැලිපිල්ල
      (c) ගණක රාමු (d) කෘත්‍රිම මැටි (ක්ලේ)
   යන ද දරුවන්ගේ සංවර්ධනය සඳහා ඉවහල් වන අයුරු සාකච්ඡා කරන්න.

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(6) (i)
- ඩිම්බ අවධිය - ඩිම්බ පරිණතියේ සිට සංසේචනය තෙක් සති 02 දක්වා
- කළල අවධිය - සති 02 සිට මාස 02 දක්වා
- භ්‍රෑණ අවධිය - මාස 02 සිට උපත දක්වා

(කරුණු 3ට ලකුණු 03යි)

(ii) මුල් ළමාවිය දරුවාගේ විවිධ වර්ධන ස්වභාවය අනුව එම දරුවා සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කරයි.

- කායික වර්ධනය
  - ★ පළමු වසර 2 හා සසඳන විට කායික වර්ධන වේගය අඩුය.
  - ★ කිරි දත් 20 සම්පූර්ණ වේ.
  - ★ අස්ථි භවනය සිදු වෙමින් පවතී. එම නිසා අස්ථි ඝනත්වය වැඩි වේ.
  - ★ සියුම් හා විශාල මාංශ පේෂි වර්ධනය ද සිදුවේ.
- භාවික වර්ධනය
  - ★ භාවික අස්ථාවරයි.
  - ★ තීව්‍රයි.
  - ★ ක්ෂණිකයි.

- භාෂා වර්ධනය
  - ★ වචන මාලාව දියුණු වේ.
  - ★ වචන ගළපා කෙටි වාක්‍ය භාවිත කරයි.
  - ★ ගායනා කිරීම.
  - ★ නැහැ බැහැ සංකල්ප නිසි ලෙස භාවිතයට හුරුවේ.

- සමාජ වර්ධනය

- බුද්ධි වර්ධනය
  - ★ සරල සංකල්ප සාධනය කිරීමේ හැකියාව ඇත.
    උදා :- සජීවී, අජීවී දේවල් හඳුනා ගැනීම.
    වැඩි ප්‍රමාණය, අඩු ප්‍රමාණය, දිග කොට, අසර (අනුපිළිවෙලට) වැනි ගණිත සංකල්ප ගොඩ නගා ගනියි.

  - ★ පරිකල්පනය ඉතා දියුණුය.

- චාලක වර්ධනය

  - ★ සියුම් මාංශ පේශි හා විශාල මාංශ පේශි වර්ධනය වැඩි දියුණු වේ.
    සියුම් - මැටි, ක්ලේ, ආදියෙන් නිර්මාණ කිරීම - පාට කිරීම - නර්තනය
    විශාල - බයිසකල් පැදීම, ඔන්චිලි පැදීම, පඩි නැගීම බැසීම.

(විවිධ වර්ධනයන්ට අනුව කරුණු 3ක් විස්තර කිරීමට ලකුණු 03යි)

(iii) a **සීසෝව** - විශාල මාංශ පේශි වර්ධනය - උස් පහත් චලනයන්ට හුරුවීම, අන් අයකු සමඟ සමබරතාවය ඇති කර ගනිමින් ක්‍රියාකාරී වීමට හැකියාව ලබයි.

b **වැලිපිල්ල** - ඇස හා අතෙහි සියුම් මාංශපේශි සමායෝජනය ඇති කරයි. විවිධ හැඩ නිර්මාණයට යොමු වෙයි. අකුරු හඳුනා ගනියි.

c **ගණක රාමු** - ගණිත සංකල්ප ගොඩ නගයි. ලොකු ගොඩකින් කුඩා ගොඩවල් වෙන් කිරීමට හැකියාව ලබයි.


d **කෘත්‍රිම මැටි (ක්ලේ)** - සියුම් මාංශ පේශි වර්ධනය වේ. නිර්මාණ ක්‍රියා දියුණු වේ. මානසික තෘප්තිය ඇති වේ.

**(කරුණු 4ක් සාකච්ඡා කිරීමට ලකුණු 1x4)**

**ලකුණු 04යි**


**මුළු ලකුණු 10යි**

## 06වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරා ඇති පිරිස 72%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ට වඩා ලබාගත් පිරිස 10%ක් පමණ වන අතර, 31%ක් සිසුන් ලබාගෙන ඇත්තේ ලකුණු 2ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර, (iii) වන අනු කොටසෙහි a,b,c, හා d වශයෙන් කොටස් 4ක් ඇත. ඉන් (iii) වන අනු කොටසේ (a,b,c, හා d) වල පහසුතාව 50%ට වඩා වැඩිය. ඉතිරි අනු කොටස් 2හිම පහසුතාව 35%ට වඩා අඩුය. පහසුතා අඩුම අනු කොටස (ii) වන අතර, එහි පහසුතාව 30%කි. පහසුතාව වැඩිම අනු කොටස (iii) d වන අතර, එහි පහසුතාවය 73%කි.

- ⋆ i කොටසට ලබා ඇති පහසුතාව 35%කි. එයට හේතුව පූර්ව ප්‍රසව සංවර්ධනයේ අවධිවලට අදාළ කාල සීමාවන් නිරවුල්ව වටහා ගෙන නොමැති වීමය. මෙම අවධි තුනට අදාළ කාල සීමාව වෙන් කර හඳුනා ගැනීමට හැකියාව ලබා දිය යුතුය.

- ⋆ ii කොටසට ලබා ඇති පහසුතාව 30%කි. එසේ වී ඇත්තේ මුල් ළමාවිය සංවර්ධන අවධිය වෙන් කර හඳුනාගැනීමේ දුර්වලතාවයයි. මුල් ළමාවිය සංවර්ධන අවධියේ ළමුන් තුළින් පිළිබිඹු කෙරෙන ලක්ෂණ, එවැනි ළමුන් නිරීක්ෂණය කිරීම මගින් හඳුනාගැනීමට අවස්ථා සැලැස්විය යුතුය.

## 07 ප්‍රශ්නය

**7. (i) ආර්තව චක්‍රය හඳුන්වන්න.**

**(ii) නව යොවුන් අවධිය තුළ සීඝ්‍ර කායික වර්ධනයක් පෙන්නුම් කෙරේ. සාකච්ඡා කරන්න.**

**(iii) ළදරුවාගේ පෝෂණය සඳහා මව්කිරි ලබා දීමෙන් දරුවාට හා මවට වාසි සැලසේ. එම වාසි විස්තර කරන්න.**

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(7) (i) ඩිම්බ කෝෂවල නිපදවූ ඩිම්බයක්, පරිණත වී පැලෝපීය නාලයට ඇතුලු වී සංසේචනය නොවීම නිසා අධිරෝපණය සඳහා සූදානම් වූ ගර්භාෂ ඇතුලු ආස්තරයන්, ප්‍රජනක හෝමෝන ක්‍රියාකාරිත්වය නිසා රුධිර වාහිණී සමග බිඳ වැටීමෙන් අනතුරුව එම ද්‍රව්‍ය යෝනි මාර්ගය තුළින් පිටවීම සඳහා දින 28ක් තුළ සිදුවන ක්‍රියාවලිය ආර්තව චක්‍රයයි.

**(ලකුණු 03යි)**

(ii)
- උස හා බර වැඩිහිටි අනුපාතයන් අනුව වර්ධනය වේ.
- ද්විතියික ලිංගික ලක්ෂණ_වර්ධනය වේ.
- අස්ථි භවනය සීඝ්‍රයෙන් සිදුවේ / අස්ථි ඝනත්වය වැඩි වීම.
- චාර්වක දත් වර්ධනය ආරම්භ කරයි.
- සිරුරේ පද්ධතිවල වර්ධනය හා ක්‍රියාකාරීත්වය වැඩිහිටි අවධියට සුදුසු ලෙස සිදුවේ.


**(කරුණු 3ක් සාකච්ඡාවට ලකුණු 03යි)**

(iii)
- කොලස්ට්‍රම් මගින් පෝෂණය හා ප්‍රතිශක්තිකරණය ලබා දේ.
- බිළිඳාට වයස මාස 06ක් පමණ වන තෙක් අවශ්‍ය පෝෂක සපයයි.
- දරුවා හා මව අතර අන්‍යෝන්‍ය සෙනෙහස වර්ධනය කිරීම.
- ගර්භාෂය යථා තත්ත්වයට පත්වීමට හේතු වේ.
- කාලය, මුදල් වැය කිරීම අඩු නිසා වාසිදායකය.
- සෞඛ්‍යාරක්ෂිත බව.

**(කරුණු 4ක් විස්තර කිරීමට ලකුණු 03යි)**


**(මුළු ලකුණු 10යි)**

07වන ප්‍රශ්නය පිළිබඳ සමස්ථ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරා ඇති පිරිස 72%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 30% ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 47% ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 16% ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 7% ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ට වඩා ලබාගත් පිරිස 7%ක් පමණ වන අතර, 30%ක් සිසුන් ලබාගෙන ඇත්තේ ලකුණු 2ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර, ඉන් අනු කොටස් 2ක පහසුතාව 40%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (i) වන අතර, එහි පහසුතාව 36%කි.

⋆ i කොටසට ලබා ඇති පහසුතාව 36%කි. විද්‍යානුකූලව කරුණු නිරවුල්ව දැන නොසිටීම එයට හේතු විය හැකිය. හෝමෝන වල ක්‍රියාකාරීත්වය තුළින් ආර්ථවය සිදුවන අයුරු රූප සටහන්, සංයුක්ත තැටි හා වීඩියෝ පට මගින් ඉදිරිපත් කිරීම මෙය වටහා දීමට ඇති පහසු මගකි. මෙහිදී ‘හඳුනවන්න’ යටතේ අවශ්‍ය කරුණු ගොනුකර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීම අවශ්‍ය වේ.

## III කොටස

**3. පිළිතුරු සැපයීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1 පිළිතුරු සැපයීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු :**

I පත්‍රයඃ

* I පත්‍රයට පිළිතුරු සැපයීමේදී ප්‍රශ්නයෙන් අසා ඇති දේ නිවැරදිව අවබෝධ කර ගැනීම.

* ප්‍රශ්නයට ගැළපෙන වඩාත්ම නිවැරදි වරණය තෝරා ගැනීමේදී, තර්කාණුකූලව සිතා බැලීම තුළින් ප්‍රතිකර්ශක (නොගැළපෙන) හඳුනාගැනීම.

* එක් වරණයක් පමණක් නිශ්චිතව තෝරා සටහන් කිරීම.

II පත්‍රයඃ

* සිද්ධියක් ඇසුරින් ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවකදී එය කියවා පැහැදිලිව අවබෝධ කර ගැනීම.

* ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේදී යොදා ඇති ක්‍රියාපදය පිළිබඳව විමසිලිමත් වීම.
  උදාඃ - සඳහන් කරන්න
  - හඳුන්වන්න
  - විස්තර කරන්න
  - පැහැදිලි කරන්න
  - අර්ථ දක්වන්න
  ඒ අනුව පිළිතුරු සංවිධානය කර ගැනීම.

* පිළිතුරු ලිවීමේදී ප්‍රකාශන ශක්තිය පිළිබිඹු වන ආකාරයට ඉදිරිපත් කිරීම.
  - විස්තර කිරීමකදී ඡේද වෙන් කිරීම.
  - කරුණු ඉදිරිපත් කිරීමේදී කරුණු වෙන් වෙන් ව දැක්වීම.
  - රූපසටහන් අවශ්‍ය තැන්හිදි නම් කරන ලද රූප සටහන් ඉදිරිපත් කිරීම.
  - රූපසටහන් ඇඳීම සඳහා පැන්සල භාවිත කිරීම.

* තාක්ෂණික වචන (Technical terms) නිවැරදිව ලිවීම.

* පිළිතුරු ලිවීමේදී ප්‍රශ්න අංක සහ ඒවායේ අනු කොටස් නිවැරදිව දැක්වීම.

* ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේදී කාලය පිළිබඳ සැලකිලිමත් වීම.

* ප්‍රශ්නයෙන් අසා ඇති කරුණු ප්‍රමාණවත්ව ඉදිරිපත් කිරීම.

* එකම කරුණ නැවත නැවතත් ලිවීමෙන් වැළකීම

### 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය හා නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරු කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම.
* ඉගෙනුම් අවස්ථාවට / විෂය අන්තර්ගතයට අදාල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කිරීම.
* ඉගෙනුම් අත්දැකීම් ලබා දීමේදී උචිත ඉගෙනුම් උපකරණ භාවිත කිරීම.
* ගවේෂණය සඳහා සිසුන්ට අවස්ථා සලසමින් ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම.
* ප්‍රායෝගික ක්‍රියාකාරකම් මනාව සැලසුම් කර, පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීම.
* රෙදිපිළි තාක්ෂණය විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රායෝගික කුසලතා ප්‍රගුණ කිරීමට ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කිරීම.
* ගුරු සිසු දෙපිරිසම ඉගෙනුමට ඉගෙනීමට යොමු වීම. එමගින් ඔවුන් යාවත්කාලීන වීම.
* ක්‍රියාකාරකම් තුළ සිසුන් තක්සේරුකරණයට භාජනය කිරීමෙන් අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.
* විවිධ වර්ගයේ බහුවරණ වනුවලට පිළිතුරු ලිවීමේ අභ්‍යාසවල යෙදවීම.
* ව්‍යුහගත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
* ගුරු මහත්මීන් සේවාස්ථ සැසිවලට සහභාගි වීම.
* ගුරු මහත්මීන්, ගුරු උපදේශක මහත්මීන් සහ විෂය අධ්‍යක්ෂවරුන් අතර සහ සම්බන්ධතාව පවත්වා ගැනීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බවක් වර්ධනය කර ගැනීම.